# 8

## මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායිතාව

කොවිඩ්-19 වසංගතය විසින් ඇති කරන ලද අවිනිශ්චිතතාවන් සහ පෙර නොවූ විරූ විවිධ අභියෝග මධ්‍යයේ වුව ද, 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගෙන යනු ලැබීය. ණය හා අත්තිකාරම් සහ ආයෝජන වැනි බැංකු අංශයේ වත්කම් සාපේක්ෂව මධ්‍යස්ථ ව්‍යාප්තියක් පෙන්නුම් කළ අතර, තැන්පතු වල ඉහළ යෑම වත්කම් පදනමේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. කොවිඩ්-19 වසංගතය හරහා ඇති වූ බලපෑම කළමණාකරණය කිරීමේ අරමුණින් මහ බැංකුව නියාමන ලිහිල් කිරීම් (Regulatory Forbearance) ගණනාවක් හඳුන්වා දුන් අතර, එමගින් බැංකුවලට ප්‍රමාණවත් ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගැනීමට ඉඩ සලසන ලදී. කොවිඩ්-19 වසංගතය නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා ණය සහන කාලයක් ලබා දී තිබියදීත්, බැංකු අංශයේ ණය අවදානම් කළමනාකරණයට අක්‍රීය ණයවල වැඩි වීම ප්‍රධාන අභියෝගයක් විය. ණය සහන කාලය අවසන් වූ පසු වත්කම්වල ගුණාත්මකභාවය කෙරෙහි කොවිඩ්-19 වසංගතයෙන් ඇති වූ සැබෑ බලපෑම පිළිබිඹු වනු ඇත. මහ බැංකුව විසින් පීඩාවට පත් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් යථා තත්වයට පත් කිරීමේ වැදගත්කම හඳුනාගනිමින් 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයන්ට බැංකු අංශය තුළින් සහනදායී ණය ලබා දීම සඳහා සුවිශේෂී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී. වත්කම් පදනම, ණය සහ තැන්පතුවල සංකෝචනය මෙන්ම අක්‍රීය ණය ඉහළ යෑම සහ ලාභදායීත්වය පහත වැටීම හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අවදානම්, 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී ඉහළ ගියේය. බලපත්‍රලාභී මුදල් සමාගම් කිහිපයක් නියමිත අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල නොවුණද, සමස්තයක් ලෙස මෙම අංශයේ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා මට්ටම් අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළින් පැවතුණි. මූල්‍ය පද්ධතියේ අනෙකුත් අංශ මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, ප්‍රාථමික ගැනුම්කරුවන්, ඒකක භාර සහ කොටස් තැරැව්කාර සමාගම් වැනි අංශ ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර රක්ෂණ අංශය මන්දගාමී විය. පෙර නොවූ විරූ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම් මධ්‍යයේ 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල සීමාව තුළ දී අන්තර් බැංකු මුදල් වෙළඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතා තත්ත්වයක් අඛණ්ඩව නිරීක්ෂනය විය. ඒ සඳහා ප්‍රධාන වශයෙන්, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය පහළ දැමීම, මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සහ විශේෂ ණය යෝජනා ක්‍රම හරහා අරමුදල් බෙදා හැරීම හේතු විය. 2020 වසරේ මාර්තු මස මැද භාගයේ දී කොවිඩ්-19 වසංගතය පැතිරී යෑම ආරම්භ වීමත් සමග අපනයන ආදායම් ගලා නොඒම සහ විදේශීය ප්‍රේෂණ පහළ මට්ටමක පැවතීම මෙන්ම රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සහ කොටස් වෙළඳපොළ වැනි ප්‍රාග්ධන වෙළඳපොළවලින් විදේශ ආයෝජන පිටතට ගලා යෑම හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ මත පීඩනයක් ඇති විය. කෙසේ වෙතත්, අත්‍යවශ්‍ය නොවන ආනයන හා තෝරාගත් බාහිර ප්‍රේෂණ සඳහා තාවකාලික සීමාවන් පැනවීම, අපේක්ෂිත තත්ත්වයට වඩා ඉහළ සේවා නියුක්තයන්ගේ ප්‍රේෂණ සහ විනිමය ගැණුම් විකුණුම් හුවමාරු (Sell - Buy Forex SWAP) වෙන්දේසි හඳුන්වාදීම ඇතුළු විදේශ විනිමය වෙළඳපොළට මහ බැංකුවෙහි මධ්‍යස්ථ මැදිහත්වීම් සමග විනිමය අනුපාතය මත පීඩනය ලිහිල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සුළු අවප්‍රමාණයක් පමණක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් වෙළඳපොළේ ඇති අතිරික්ත ද්‍රවශීලතාවය, උපායමාර්ගික භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර නිකුත් කිරීමේ විධිවිධාන ස්ථාපිත කිරීම, වෙන්දේසිවල ලංසු පිළිගැනීම සඳහා උපරිම ඵලදායී අනුපාත ප්‍රකාශයට පත් කිරීම හා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළෙන් මිලදී ගැනීම හේතුවෙන් රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික වක්‍රය පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්වීය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසරේ මාර්තු මස මැද හා මැයි මස මුල දී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව වාර්තා කළ සැලකිය යුතු පසුබෑමෙන් යථා තත්ත්වයට පත් විය. විදේශ ආයෝජන පිටතට ගලායෑම අඛණ්ඩව පැවතුණ ද, අඩු පොලී අනුපාතයක් පවතින පරිසරයක් යටතේ කොටස් ආයෝජන වෙත දේශීය ආයෝජකයන්ගේ රුචිය වැඩි වීම, වෙළඳපොළ යථා තත්ත්වයට පත් වීමට ඉවහල් විය. ඉදිරියේ දී ද, මූල්‍ය අංශයේ ප්‍රධාන නියාමන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව එක් එක් ආයතනවල අවදානම් මෙන්ම පද්ධතිමය අවදානම් පිළිබඳව අඛණ්ඩව සැලකිලිමත් වන අතර මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා පූර්ව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

## මූල්‍ය ආයතනවල වර්ධනයන්

### බැංකු අංශය

- **කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ ගෝලීය හා දේශීය ආර්ථික කටයුතු මන්දගාමී වීම හේතුවෙන්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බැංකු අංශය මධ්‍යස්ථ කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී.** ණය අවදානම ඉහළ යමින් තිබියදීත් 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී, ප්‍රමාණවත් ප්‍රාග්ධනයක්, ද්‍රවශීලතාවයන් හා වෙන්කිරීම් ආවරණ අනුපාතයන්ට අනුගතව බැංකු අංශය අඛණ්ඩව ක්‍රියාත්මක විය. තවද, ලාභාංශ ගෙවීම් හා ලාභ බෙදාහැරීම් සීමා කිරීමත් සමඟ ප්‍රාග්ධන අනුපාතයන් තවදුරටත් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ණය සහනය (debt moratorium) යටතේ ණය සහ අත්තිකාරම් වර්ගීකරණය සීමා කර තිබියදීත් අක්‍රීය ණය අඛණ්ඩව ඉහළ ගියේය. කොවිඩ්-19 බලපෑමට ලක් වූ ණයගැතියන්ට ලබා දුන් ණය සහන කාලය සහ ඒ සම්බන්ධ ගිණුම්කරණ ගැලපීම් බැංකු අංශයේ අක්‍රීය ණය අනුපාතිකය පවත්වා ගැනීමට උපකාරී වුව ද, තාවකාලික ණය සහනය අවසන් වීමත් සමගම වත්කම්වල ගුණාත්මකභාවය කෙරෙහි ඇති වූ සැබෑ බලපෑම පිළිබිඹු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ණය කළඹෙන් සැලකිය යුතු කොටසක් ණය සහනය යටතේ පවතින බැවින් බැංකුවල ද්‍රවශීලතාවය සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, බැංකු පනතේ 2020 අංක 02 විධානය යටතේ ද්‍රවශීල වත්කම් පිළිබඳ අර්ථ දැක්වීම පුළුල් කිරීම සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අඩු කිරීම වැනි ද්‍රවශීලතාවය සඳහා සහන ක්‍රියාමාර්ග ගැනීමෙන් ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතයට අනුකූල වීමට බැංකුවලට උපකාර වී ඇත. කොරෝනා වෛරසය පැතිරීමෙන් ගෝලීය හා දේශීය ආර්ථිකවල ක්‍රියාකාරකම් මන්දගාමීවීම හේතුවෙන් ආර්ථික වර්ධනයේ සිදුවන පසුබෑම බැංකු අංශයේ කාර්යසාධනය කෙරෙහි බලපානු ඇත. එම නිසා, ආර්ථිකය මන්දගාමී වීමෙන් මෙන්ම හඳුන්වා දී ඇති ණය සහනය හේතුවෙන් සිදු වන සෘජු හා වක්‍ර බලපෑම් පිළිබඳව බැංකු අංශය සැලකිලිමත් විය යුතුය.

- **2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස 8 තුළ දී බැංකු අංශයේ වත්කම්වල වර්ධනය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වැඩිදියුණු වී ඇත.** මෙම අංශයේ සමස්ත වත්කම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී පෙන්නුම් කළ සියයට 2.4 (රුපියල් බිලියන 277.8) ක වර්ධනයට සාපේක්ෂව 2020 සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සියයට 10.5 (රුපියල් ට්‍රිලියන 1.3) කින් රුපියල් ට්‍රිලියන 13.8ක් දක්වා වර්ධනය විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී වත්කම්වල වර්ධනයට හේතු වූයේ ණය හා අත්තිකාරම් (රුපියල් බිලියන 725.6) සහ ආයෝජනවල (රුපියල් බිලියන 598.3) වැඩි වීමයි. 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට බැංකු අංශයේ වත්කම් පදනමට තැන්පතු (රුපියල් ට්‍රිලියන 10.3) සහ ණය ගැනීම් (රුපියල් ට්‍රිලියන 1.7) වලින් මූලික වශයෙන් අරමුදල් සපයන ලදී. වත්කම්වල වාර්ෂික වර්ධන වේගය 2018 වසර අවසානයේ දී පැවති සියයට 14.6ක සිට 2019 වසර අවසානයේ දී සියයට 6.2ක් දක්වා අඩු වූ අතර, එය 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට ක්‍රමයෙන් සියයට 14.6ක් දක්වා වර්ධනය විය.

- **වාර්ෂික ණය වර්ධන වේගය 2018 වසර අවසානයේ දී පැවති සියයට 19.6ක සිට, 2019 වසර අවසානයේ දී සියයට 5.6ක අගයක් ගත් අතර, 2020 වසරේ අගෝස්තු මස අවසානයේ දී සියයට 13.5ක අගයකට ළඟා විය.** බැංකු අංශයේ ණය 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ දී, වාර්තා වූ රුපියල් බිලියන 102.7 (සියයට 1.3) ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 725.6 (සියයට 8.9) කින් වර්ධනය වී 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් ට්‍රිලියන 8.8ක අගයක් ගන්නා ලදී. 2020 වසරේ දී රුපියල් ණය සියයට 7.7කින් වර්ධනය වූ අතර, එය මුළු ණයවල වූ වර්ධනයට සියයට 69.3ක දායකත්වයක් දක්වන ලදී. 2020 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සිදු වූ මුළු ණයවල වර්ධනයෙන් සියයට 76.0ක දායකත්වයක් දක්වනු ලබන්නේ ශ්‍රී ලංකා රජයට (රුපියල් බිලියන 354.2) හා රජයට අයත් ව්‍යාපාරවලට (රුපියල් බිලියන 197.3) ලබා දුන් ණයයි. ණය භාණ්ඩ වශයෙන් ගත් කළ ණයපත් සහ බැංකු හා මූල්‍ය ආයතනවල ලබාදුන් ණයවල පිළිවෙළින් රුපියල් බිලියන 4.2ක හා රුපියල් බිලියන 7.3ක අඩු වීම හැර අනෙකුත් සියලු ණය භාණ්ඩ මෙම කාලපරිච්ඡේදය තුළ වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. 2020 වසරේ ජූනි මස අවසානය වන විට බැංකු අංශයේ ණය ප්‍රධාන වශයෙන් පරිභෝජනය (සියයට 18.2), ඉදිකිරීම් (සියයට 15.6), තොග හා සිල්ලර වෙළඳ කටයුතු (සියයට 13.2), නිෂ්පාදන (සියයට 10.6),

8.1 රූප සටහන

## 2020 වසරේ මූල්‍ය ආයතනවල විශේෂිත කරුණු

### බැංකු අංශය

- 13.5 — ණයවල වාර්ෂික වර්ධනය (%)
- 17.1 — තැන්පතුවල වාර්ෂික වර්ධනය (%)
- 5.4 — දළ අක්‍රීය ණය අනුපාතය (%)
- 1.3 — වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර, %)

2020 අගෝස්තු වන විට

### බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය

- -1.2 — ණයවල වාර්ෂික වර්ධනය (%)
- -4.0 — තැන්පතුවල වාර්ෂික වර්ධනය (%)
- 13.1 — දළ අක්‍රීය ණය අනුපාතය (%)
- 0.4 — වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර, %)

2020 අගෝස්තු වන විට


### රක්ෂණ අංශය

- 13.0 — සමස්ත වත්කම්වල වාර්ෂික වර්ධනය (%)
- -2.8 — දළ ලියාපදිංචි වාරිකයන්ගේ වාර්ෂික වර්ධනය (%)
- -0.5 — ආයෝජන ආදායම්වල වාර්ෂික වර්ධනය (%)
- 32.7 — බදු පෙර ලාභයෙහි වාර්ෂික වර්ධනය (%)

2020 ජූනි වන විට

කොවිඩ්-19 වසංගතය හරහා ඇති වූ බලපෑම කළමනාකරණය කිරීමේ අරමුණින් මහ බැංකුව නියාමන රාමුව ලිහිල් කිරීම් ගණනාවක් හඳුන්වා දෙන ලදී.

මහ බැංකුව 2020 පළමු මාස අට තුළ දී කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයන්ට බැංකු අංශය තුළින් සහන ණය ලබා දීම සඳහා සුවිශේෂී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී.




බැංකු අංශයේ වත්කම්, ණය සහ අත්තිකාරම් සහ ආයෝජන සාපේක්ෂව මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. බලපත්‍රලාභී මුදල් සමාගම් කිහිපයක් අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල නොවුනද, සමස්තයක් ලෙස මෙම අංශයේ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා මට්ටම නියාමන අවම අවශ්‍යතාවන්ට වඩා ඉහළින් පැවතුනි.

මූල්‍ය පද්ධතියෙහි අනෙකුත් අංශයන් මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී.


8

**8.2 රූප සටහන**
**බැංකු අංශයේ වත්කම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.4 රූප සටහන**
**බැංකු අංශයේ අරමුදල් මූලාශ්‍ර**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යටිතල පහසුකම් සංවර්ධනය (සියයට 9.1) සහ කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර (සියයට 8.1) යන අංශ වලට ලබා දී ඇත. මේ අතර, ප්‍රධාන අංශ අතරින් 2020 වසරේ පළමු භාගය තුළ දී මූල්‍ය සේවා, වෙළඳ හා සංචාරක අංශ සඳහා ලබා දී ඇති ණය පහත වැටීමක් වාර්තා වූ අතර අනෙකුත් ප්‍රධාන අංශ සඳහා ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ ගොස් තිබේ. තවද, 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට ක්‍රියාකාරී ණයවලින් සියයට 25ක් හා අක්‍රීය ණයවලින් සියයට 20ක් ණය සහන කාලය ලබාගෙන ඇත.

- **2019 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී පැවති බැංකු අංශයේ ආයෝජනය රුපියල් බිලියන 254.3 (සියයට 9.4) ට සාපේක්ෂව, 2020 වසරේ අදාළ කාල කාලපරිච්ඡේදය තුළ දී, රුපියල් බිලියන 598.3 (සියයට 19.8) ක් විය.**

**8.3 රූප සටහන**
**බැංකු අංශයේ ණය සහ අත්තිකාරම්**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **2020 වසරේ අගෝස්තු මාසය අවසාන වන විට බැංකු අංශයේ වර්ධනය සඳහා විශාල වශයෙන් අරමුදල් සපයනු ලැබුවේ සමස්ත වත්කම්වලින් සියයට 74.8ක් වූ තැන්පතු මගිනි.** බැංකු අංශයේ තැන්පතු පදනම සියයට 12.9ක වර්ධනයත් සමඟ රුපියල් ට්‍රිලියන 1.2කින් ඉහළ ගිය අතර මෙය, මූලික වශයෙන් රුපියල් තැන්පතුවලින් සමන්විත විය. 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාල කාලපරිච්ඡේදය තුළ දී, කාලීන තැන්පතු වැඩි අරමුදල් ප්‍රමාණයක් (රුපියල් බිලියන 596.2) ක්, ආකර්ෂණය කරගත් අතර, ජංගම හා ඉතිරිකිරීමේ තැන්පතුවල එකතුව රුපියල් බිලියන 531.7කින් ඉහළ ගියේය. කෙසේ වුවද, මුළු තැන්පතු ප්‍රමාණයට ජංගම හා ඉතුරුම් තැන්පතු දක්වන අනුපාතය (CASA) 2019 වසර අවසානයේ දී, පැවති සියයට 31.4ක සිට 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 32.9ක් දක්වා ඉහළ යන ලදී. මෙයට හේතුවූයේ ජංගම ඉල්ලුම් හා ඉතුරුම් තැන්පතු අනුපාතිකයේ පාදක අගය සාපේක්ෂව පහළ අගයක පැවතීමය. 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට මුළු ණය ගැනීම් රුපියල් ට්‍රිලියන 1.7ක් විය. 2019 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, වාර්තා වූ රුපියල් බිලියන 142.0ක අඩු වීමට සාපේක්ෂව, 2020 වසරෙහි අනුරූප කාලපරිච්ඡේදය තුළ දී බැංකු අංශයේ ණය ගැනීම් රුපියල් බිලියන 57.1ක වැඩි වීමක් වාර්තා කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, ණය ගැනීම්වල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2019 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට වාර්තා කළ සියයට 4.8ක සෘණ අගයට සාපේක්ෂව 2020 අගෝස්තු මස අවසානය වන විට

8

**8.5 රූප සටහන**


**බැංකු අංශයේ අක්‍රීය ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.6 රූප සටහන**

**බැංකු අංශයේ ද්‍රවශීලතා තත්ත්වය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 7.1ක් දක්වා ඉහළ ගියේය. 2020 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, රුපියල් ණය ගැනීම්වල රුපියල් බිලියන 29.1ක අඩුවීමක් වාර්තා වූ අතර, විදේශ විනිමය ණයගැනීම් එ.ජ. ඩොලර් මිලියන 331.6 (රුපියල් බිලියන 86.2) ක ඉහළ යෑමක් වාර්තා කරන ලදී.

- **බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමක් පෙන්නුම් කළ නමුත් එය කළමනාකරණය කළ හැකි මට්ටමක පැවතුණි.** 2019 වසර අවසානය වන විට පැවති අක්‍රීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 381.7ක සිට, 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 481.3ක් දක්වා රුපියල් බිලියන 99.6 (සියයට 26.1) කින් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට පැවති අක්‍රීය ණය අනුපාතය සියයට 4.7ක සිට 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 5.4ක් දක්වා ඉහළ ගියේය. 2020 වසරේ පළමු භාගයේ දී, කෘෂිකර්මික අංශය හැරුණු විට අනෙකුත් සියලු ප්‍රධාන ආර්ථික අංශයන් හි අක්‍රීය ණය ප්‍රමාණයන් ඉහළ යෑමක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අක්‍රීය ණය කාණ්ඩ අතුරින් වැඩි වෙන්කිරීම් අවශ්‍ය වූ, අඩමාන හා අලාභ ණය කොටස ඉහළ යෑමේ ප්‍රවණතාව සමග සාපේක්ෂව අඩු වෙන්කිරීම් අවශ්‍ය විශේෂයෙන් සඳහන් කළ යුතු හා ප්‍රමිතියෙන් අඩු ණය කාණ්ඩවල කොටස් අඩුවීම මත වෙන්කිරීම් ආවරණ අනුපාතය 2019 වසර අවසානය වන විට පැවති සියයට 52.6ක සිට 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 53.8ක් දක්වා ප්‍රගතියක් වාර්තා කරන ලදී.


- **බැංකු අංශය, අවම නියාමන අවශ්‍යතාවයන් ඉක්ම වූ ප්‍රමාණවත් ද්‍රවශීලතා ස්වාරක්ෂකයක් පවත්වා ගනිමින් ක්‍රියාත්මක විය.** 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට, අර්ථ දැක්වීම පුළුල් වීමෙන් ඇති වූ අතිරේක ද්‍රවශීල වත්කම් සමග, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය, දේශීය බැංකු ඒකකවල (DBU) සහ අක්වෙරළ බැංකු ඒකකවල (OBU) පිළිවෙළින් සියයට 38.5ක් සහ සියයට 44.4ක් වූ අතර, මෙය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාව වන සියයට 20ට වඩා ඉහළ අගයකි. මේ අතර, 2020 වසරේ අගෝස්තු මස අවසානයේ දී මුළු වත්කම් වලට ද්‍රවශීල වත්කම්වල අනුපාතය සියයට 34.5ක් විය. 2019 අගෝස්තු මස අවසානය වන විට, සියයට 88.2ක් වූ තැන්පතු සඳහා වන ණය අනුපාතය 2020 වසරේ අගෝස්තු මස අවසන් වන විට, සියයට 85.5ක් දක්වා සුළු වශයෙන් අඩු විය. 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට, බැංකු අංශයේ රුපියල් සහ සියලු විනිමය සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාත පිළිවෙළින් සියයට 272.7ක් සහ 206.7ක් වූ අතර, එය අවම නියාමන අගය වූ සියයට 90.0ට වඩා ඉහළ අගයක පැවතුණි. 2020 වසරේ ජූනි මස අවසන් වන විට, ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය සියයට 90.0ක අවම අවශ්‍යතාවයට වඩා ඉහළින් සියයට 132.0ක පැවතුණි.

- **විදේශ විනිමය වත්කම් වලට වඩා විදේශ විනිමය වගකීම් ඉහළයෑම හේතුවෙන්, බැංකු අංශයේ විදේශ මුදල් නිරාවරණයේ ශුද්ධ වටිනාකම, 2019 වසරේ ජූනි මස අවසානයට සාපේක්ෂව 2020 වසරේ ජූනි මස අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 8.1කින්**

**අඩුවිය.** 2020 වසරේ ප්‍රථම භාගය තුළ දී, විදේශ මුදලින් නම් කර ඇති ශේෂපත්‍ර වත්කම් ප්‍රධාන වශයෙන් ඉහළ යෑමට බැංකු සමග කළ ස්ථානගත කිරීම් හා ආයෝජන හේතු වූ අතර විදේශ මුදලින් නම් කර ඇති ශේෂපත්‍ර වගකීම් ප්‍රධාන වශයෙන් ඉහළ යෑමට විදේශ විනිමය තැන්පතු හේතුවිය. 2020 වසරේ ජූනි මාසය අවසන් වන විට, ශුද්ධ විදේශ මුදල් නිරාවරණය, බැංකුවල නියාමන ප්‍රාග්ධනයේ මෙන්ම ශේෂ පත්‍රයේ විදේශ මුදල් වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 0.5ක් විය. බැංකු අංශය විසින් 2019 වසරේ ජූනි මස අවසානයේ පැවති රුපියල් බිලියන 7.4ක රුපියල් අගයකට සමාන වූ අතිරික්ත විදේශ මුදල් නිරාවරණය හා සසඳන විට 2020 වසරේ ජූනි මස අවසානයට රුපියල් බිලියන 6.3ක රුපියල් අගයකට සමාන වූ අතිරික්ත විදේශ මුදල් නිරාවරණයක් වාර්තා කරන ලදී. 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී, විදේශ මුදල් නැවත ප්‍රතිගණනය මගින් රුපියල් බිලියන 14.1ක ශුද්ධ ආදායමක් උපයන ලදී.


- **2020 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, වෙළෙඳපොළ පොලී අනුපාතික පහත වැටීම හේතුවෙන්, භාණ්ඩාගාර බැඳුම්කර වල ප්‍රාග්ධන ලාභය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රුපියල් බිලියන 3.4ක සිට රුපියල් බිලියන 7.7ක් දක්වා ඉහළ යන ලදී.** 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, රජයේ සුරැකුම්පත්වල ආයෝජන ඉහළ යෑම මීට හේතු විය.

**8.7 රූප සටහන**
**බැංකු අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.8 රූප සටහන**
**බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2020 වසරේ අගෝස්තු මස අවසානයේ දී බැංකු අංශයේ වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වා ගන්නා ආයෝජන කලඹෙන් කොටස් වෙළඳපොළට ඇති නිරාවරණය රුපියල් බිලියන 10.4ක් වූ අතර එය මුළු වත්කම් හා වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වා ගන්නා ආයෝජනවලට පිළිවෙලින් සියයට 0.1ක් හා සියයට 1.4ක් වීම නිසා බැංකු අංශයේ හිමිකම් අවදානම ඉතා සීමිත වේ.

- **2020 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බැංකු අංශයේ බදු පෙර ලාභය රුපියල් බිලියන 111.7ක් වූ අතර, මෙය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ රුපියල් බිලියන 117.5ක ලාභය හා සසඳන විට රුපියල් බිලියන 5.8ක අඩුවීමකි.** ශුද්ධ පොලී ආදායමේ අඩුවීම (රුපියල් බිලියන 9) හා අක්‍රීය ණය සඳහා වෙන්කිරීම් වැඩිවීම (රුපියල් බිලියන 27.8) හේතුවෙන්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ලාභය, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සසඳන විට පහල යන ලදී. කෙසේ වෙතත්, 2019 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී, පොලී නොවන ආදායමේ වැඩිවීම (රුපියල් බිලියන 7.0) හා පොලී නොවන වියදම් වල අඩුවීම (රුපියල් බිලියන 6.1), ලාභ සඳහා ධනාත්මක දායකත්වයක් දක්වන ලදී. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව බදු පෙර ලාභය අඩු වුවද, බදු ප්‍රතිපත්තීන්ගේ වෙනස්කම් නිසා, 2020 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී බැංකු අංශයේ බදු පසු ලාභය රුපියල් බිලියන 81.6ක් දක්වා

8

රුපියල් බිලියන 6.9කින් ඉහළ ගිය අතර, 2019 වසරේ සලකා බලන කාලපරිච්ඡේදයේ දී, බදු පසු ලාභය රුපියල් බිලියන 74.8ක් විය.

- **ලාභදායීත්ව අනුපාත තුළින් බදු පෙර ලාභයන්හි අඩුවීමක් පිළිබිඹු කරයි.** වත්කම් මත ප්‍රතිලාභය (බදු පෙර) හා හිමිකම් මත ප්‍රතිලාභය, 2019 වසරේ අගෝස්තු මාසයේදී වාර්තා කල සියයට 1.5ට හා සියයට 10.8ට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේ දී පිළිවෙළින්, සියයට 1.3ක් හා සියයට 10.6ක් දක්වා පහළ යන ලදී. තවද, මෙම කාලය තුළ දී ශුද්ධ පොලී අනුපාතය සියයට 3.6ක සිට සියයට 3.2ක් දක්වා පහළ යන ලදී. මෙහෙයුම් පිරිවැය ඉහළ යෑමේ ප්‍රතිපලයක් ලෙස කාර්යක්ෂමතා අනුපාතය 2019 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා කල සියයට 51.6ට සාපේක්ෂව, 2020 වසරේ අගෝස්තු මාසයේ දී සියයට 53.8ක් දක්වා ඉහළ යන ලදී.

- **බැංකු අංශය විසින්, 2020 වසරේ පළමු භාගය තුළ දී, ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගන්නා ලද අතර ඕනෑම අහිතකර කම්පනයක් අන්තර්ග්‍රහණය කරගැනීමට යොදා ගත හැක.** 2020 වසරේ ජූනි අවසානය වන විට, බැංකු අංශය පොදු හිමිකම් අනුපාතයය සියයට 13.1ක් ලෙස හා මුළු ප්‍රාග්ධන අනුපාතය සියයට 16.4ක් ලෙස, බාසල් III අවශ්‍යතාවයන්ට ඉහළින් පවත්වා ගනිමින් මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී. කෙසේ නමුත්, මධ්‍යකාලීනව ව්‍යාපාර වර්ධනය සඳහා වූ පුළුල් ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා අරමුදල් රැස් කිරීමේදී බැංකු පද්ධතියට අභියෝගවලට මුහුණ දීමට සිදු වනු ඇත. 2020 වසරේ ජූනි අවසානය වන විට බැංකු පද්ධතියේ තෝලන අනුපාතය (එනම්, ප්‍රාග්ධනය, ශේෂ පත්‍රයේ ඇතුළත හා පිටත නිරාවරණවල ප්‍රතිශතයක් ලෙස) සියයට 6.6ක් විය.

- **රට තුළ මූල්‍ය අන්තර්ගතභාවයට පහසුකම් සලසමින්, 2020 වසරේ පළමු භාගයේ දී, බැංකු ශාඛා ජාලය තව තවදුරටත් පුළුල් විය.** ඒ අනුව, 2020 වසරේ පළමු භාගය තුළ දී, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 150ක් ස්ථාපනය කර නව ශාඛා 9ක් ද විවෘත කරන ලද අතර, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 7ක් හා එක් ශාඛාවක් වසා දමන ලදී. තවද, කොවිඩ්-19 වසංගතය පැතිරී යෑමත් සමඟ රට තුළ පැවති වාතාවරණයත් සමඟ බැංකු කටයුතු ඩිජිටල්කරණයත් සහ ජංගම ගෙවීම් පද්ධති සඳහා ඉල්ලුම පුළුල්වීමත් 2020 ප්‍රථම භාගයේ දී නිරික්ෂණය විය.

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය

- **ණය වර්ධනය සෘණාත්මක අගයක් ගැනීම, ලාභදායීත්වය අඩු වීම සහ අක්‍රීය ණය ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය පිරිහීමට ලක් විය.** වාහන ආනයන සීමාවන් සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ මන්දගාමී ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් මට්ටම පහළ යෑම සහ ණය ආපසු ගෙවීමේ හැකියාව අඩු වීම මෙම අංශයේ

**8.1 සංඛ්‍යා සටහන**
**බැංකු අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2018 අගෝ. අවසානයට | 2019 අගෝ. අවසානයට | 2019 දෙසැ. අවසානයට | 2020 අගෝ. අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2019 අගෝ. | 2020 අගෝ. (අ) |
| මුළු වත්කම් (රු. බිලියන) | 11,040 | 12,072 | 12,523 | 13,834 | 9.3 | 14.6 |
| ණය සහ අත්තිකාරම් (රු. බිලියන) | 7,104 | 7,796 | 8,122 | 8,848 | 9.7 | 13.5 |
| ආයෝජන (රු. බිලියන) | 2,608 | 2,952 | 3,027 | 3,625 | 13.2 | 22.8 |
| තැන්පතු (රු. බිලියන) | 8,089 | 8,836 | 9,162 | 10,344 | 9.2 | 17.1 |
| ණය ගැනීම් (රු. බිලියන) | 1,548 | 1,621 | 1,679 | 1,737 | 4.7 | 7.1 |
| ප්‍රාග්ධන අරමුදල් (රු. බිලියන) | 959 | 1,096 | 1,130 | 1,206 | 14.3 | 10.0 |
| පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) (ආ) | 12.8 | 13.5 | 13.0 | 13.1 | | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) (ආ) | 16.0 | 16.7 | 16.5 | 16.4 | | |
| දළ අක්‍රීය ණය අනුපාතය (%) | 3.6 | 4.9 | 4.7 | 5.4 | | |
| ශුද්ධ අක්‍රීය ණය අනුපාතය (%) | 1.7 | 2.6 | 2.3 | 2.6 | | |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) (%) | 1.9 | 1.5 | 1.4 | 1.3 | | |
| හිමිකරු ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (බදු පසු) (%) | 14.6 | 10.8 | 10.3 | 10.6 | | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය බැංකු ඒකක) (%) | 30.0 | 31.2 | 31.0 | 38.5 | | |
| මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය (%) | 27.4 | 29.3 | 28.9 | 34.5 | | |


(අ) තාවකාලික
(ආ) ජූනි මස අවසානයට

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.9 රූප සටහන**


**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සමස්ත ණය සහ අත්තිකාරම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.10 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අක්‍රීය අත්තිකාරම්**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මන්දගාමීත්වයට හේතු විය. නියාමන අවශ්‍යතාවයන්[1] සපුරා නොමැති බලපත්‍රලාභී මුදල් සමාගම්වල සමස්ත ශුද්ධ වත්කම් සහ සමස්ත තැන්පතු වෙළඳපොළ කොටස අනුව පිළිවෙළින් සියයට 11.1ක් සහ සියයට 16.0ක් නියෝජනය කරයි. දුර්වල මූල්‍ය තත්ත්වයක් පවතින බලපත්‍රලාභී මුදල් සමාගම් නැවත නගා සිටුවීම කෙරෙහි අවධානය යොමු කරමින් එවැනි සමාගම්වල ප්‍රධාන විචක්ෂණශීලී දර්ශක අඛණ්ඩව නිරීක්ෂණය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ මූල්‍ය පද්ධතියේ දිගුකාලීන ස්ථාවරත්වය සහතික කිරීම සඳහා දුර්වල මුදල් සමාගම්වල මුදල් ව්‍යාපාර කටයුතු අත්හිටුවීම හෝ සීමා කිරීමට පියවර ගෙන ඇත. තවදුරටත්, කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා ක්‍රියාමාර්ග රැසක් හඳුන්වා දෙන ලදී. 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට බලපත්‍රලාභී මුදල් සමාගම් 41ක් (ව්‍යාපාර මෙහෙයුම් අත්හිටුවන ලද බලපත්‍රලාභී මුදල් සමාගම් දෙකක් ද ඇතුළත්ව) සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් තුනකින් සමන්විත වන අතර, සමස්ත අංශය මූල්‍ය පද්ධතියේ වත්කම්වලින් සියයට 7.6ක් නියෝජනය කරයි. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් යටතේ ක්‍රියාත්මක වන ශාඛා ජාලය ශාඛා 1426කින් සමන්විත වේ. මෙම අංශයේ රුපියල් බිලියන 25ට වැඩි ඉහළම වත්කම් පදනමක් සහිත සමාගම් 14, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ අංශයෙන් සියයට 80.1ක් නියෝජනය කරයි.

- **2019 වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ වත්කම්වල ඍණාත්මක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.** 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට මෙම අංශයේ ශුද්ධ වත්කම් ප්‍රමාණය සියයට 3.1 (රුපියල් බිලියන 44.0) කින් එනම්, රුපියල් බිලියන 1,388.7ක් දක්වා අඩු වී ඇත. ණය සහ අත්තිකාරම්වල අඩුවීම මෙම අංශයේ වත්කම් අඩු වීමට ප්‍රධාන වශයෙන්

**8.11 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සමස්ත තැන්පතු සහ ණය ගැනීම්**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1 අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සහ අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා අනුපාතය යන අවම විචක්ෂණශීලී අවශ්‍යතාවයන්ට අනුකූල නොවූ බලපත්‍රලාභී මුදල් සමාගම්

8

**8.12 රූප සටහන**


**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සමස්ත ද්‍රවශීල වත්කම් සහ ද්‍රවශීලතා අනුපාත**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.13 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ප්‍රාග්ධන තත්ත්වය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බලපා ඇත. වාහන ආනයන සීමාවන් සහ ආර්ථික මන්දගාමීත්වය හේතුවෙන් 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට ණය සහ අත්තිකාරම් කළඹ සියයට 2.5 (රුපියල් බිලියන 27.3) කින් අඩු විය.

- **පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමට ලක් විය.** මෙම කාලපරිච්ඡේදය තුළ අක්‍රිය ණය අනුපාතය සියයට 9.6ක සිට සියයට 13.1ක් දක්වා ඉහළ ගොස් ඇති අතර 2020 අගෝස්තු මස අවසානය වන විට වෙන් කිරීම් ආවරණ අනුපාතය සියයට 57.2ක් දක්වා සුළු ඉහළ යෑමක් පෙන්නුම් කර ඇත.


- **සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී මෙම අංශයේ වගකීම් සංකෝචනය විය.** 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට තුළ වාර්තා වූ සියයට 6.7ක වර්ධනයට සාපේක්ෂව 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී තැන්පතු පදනම සියයට 3.0 (රුපියල් බිලියන 22.7) කින් පහළ ගොස් ඇත. මෙම අංශයේ ණය ගැනීම් සියයට 12.2 (රුපියල් බිලියන 49.6) ක සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

- **බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල සමස්ත ද්‍රවශීලතා මට්ටමේ අතිරික්තයක් වාර්තා කර ඇත.** 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට මෙම අංශයේ සමස්ත ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම්වල අවම අවශ්‍යතාවය වන රුපියල් බිලියන 51.8ට සාපේක්ෂව රුපියල් බිලියන 73.1ක අතිරික්තයක් පෙන්නුම් කර ඇත. ඉදිරි අනාගතයේ දී ඇති විය හැකි ද්‍රවශීලතා හිඟයන් පිළිබඳ අනාවැකි මත පදනම්ව සමාගම් කිහිපයක් විසින් මහ බැංකුවේ ස්ථාපිත ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක ක්‍රමය මගින් ද්‍රවශීලතා සහාය ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇත.

- **නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ දැමීමේ මූලික අවශ්‍යතාවය 2021 ජනවාරි මාසය වන විට රුපියල් බිලියන 2.0ක් දක්වාද 2022 ජනවාරි මාසය වන විට රුපියල් බිලියන 2.5ක් දක්වාද ඉහළ නැංවීම**

**8.14 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

### 8.2 සංඛ්‍යා සටහන
### බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ තෝරාගත් දර්ශක

| අයිතම | 2018 අගෝ. අවසානයට | 2019 අගෝ. අවසානයට (අ) | 2019 දෙසැ. අවසානයට | 2020 අගෝ. අවසානයට (ආ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2019 අගෝ. (අ) | 2020 අගෝ. (ආ) |
| මුළු වත්කම් - දළ (රු. බිලියන) | 1,469.6 | 1,531.2 | 1,528.3 | 1,502.6 | 4.2 | - 1.9 |
| මුළු වත්කම් - ශුද්ධ (රු. බිලියන) | 1,406.4 | 1,442.4 | 1,432.7 | 1,388.7 | 2.6 | - 3.7 |
| ණය සහ අත්තිකාරම් - දළ (රු. බිලියන) | 1,184.6 | 1,200.3 | 1,194.7 | 1,186.2 | 1.3 | - 1.2 |
| ණය සහ අත්තිකාරම් - ශුද්ධ (රු. බිලියන) | 1,125.1 | 1,115.2 | 1,102.7 | 1,075.4 | -0.9 | - 3.6 |
| තැන්පතු (රු. බිලියන) | 718.0 | 764.6 | 756.7 | 734.0 | 6.5 | - 4.0 |
| ණය ගැනීම් (රු. බිලියන) | 440.7 | 406.9 | 405.6 | 355.9 | -7.7 | - 12.5 |
| ප්‍රාග්ධන අරමුදල් (රු. බිලියන) | 184.1 | 204.8 | 203.5 | 239.0 | 11.2 | 16.7 |
| පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) | 9.8 | 11.2 | 11.1 | 13.4 | | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) | 11.1 | 12.5 | 12.5 | 14.6 | | |
| දළ අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය (%) | 6.9 | 9.6 | 10.6 | 13.1 | | |
| ශුද්ධ අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය (%) | 2.2 | 3.1 | 3.4 | 4.3 | | |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) (%) - වාර්ෂික පදනම මත | 2.8 | 1.6 | 1.8 | 0.4 | | |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පසු) (%) - වාර්ෂික පදනම මත | 12.9 | 4.3 | 5.6 | - 2.5 | | |
| මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය (%) | 7.5 | 8.3 | 8.6 | 8.3 | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**හේතුවෙන් මෙම අංශයේ ප්‍රාග්ධන මට්ටම වර්ධනය විය.** නියාමන අවශ්‍යතා සහ දුර්වල මුදල් සමාගමක බලපත්‍රය අහෝසි කිරීම නිසා 2020 අගෝස්තු මස අවසානය වන විට මූලික ප්‍රාග්ධන මට්ටම රුපියල් බිලියන 212.7ක් දක්වා වැඩි විය. මෙම අංශයේ මූලික ප්‍රාග්ධන අනුපාතය සහ සමස්ත අවදානම් මත බර තැබූ ප්‍රාග්ධන අනුපාතය පිළිවෙළින් සියයට 13.4ක් සහ සියයට 14.6ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, නියාමන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූල නොවන දුර්වල බලපත්‍රලාභී මුදල් සමාගම් කිහිපයක් පවතී.

- **මෙම අංශයේ ලාභදායීත්වය පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු වී ඇත.** ප්‍රධාන වශයෙන් ශුද්ධ පොලී ආදායම අඩු වීම සහ ණය අලාභ වෙන් කිරීම් ඉහළ යෑම හේතුවෙන් මෙම අංශයේ ශුද්ධ ලාභය පිරිහී ඇති අතර 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී බදු පසු ලාභය රුපියල් බිලියන 3.0ක් ලෙස වාර්තා කෙරිණි. 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට ඉහළ ණය අලාභ වෙන් කිරීම් හේතුවෙන් කාර්යක්ෂමතා අනුපාතය සියයට 93.2ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙම අංශයේ ලාභදායීත්වය නිරූපණය කරන වාර්ෂික වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට පිළිවෙළින් සියයට 0.4ක සහ සියයට 2.5ක සෘණ අගයක් වාර්තා කර ඇත.

## ප්‍රාථමික අලෙවිකාර සමාගම්

- **ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සමස්ත වත්කම් සහ සමස්ත ආයෝජන කළඹ 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන වන පළමු මාස අට තුළ දී වැඩි වීමක් පෙන්නුම් කරන ලදී.** ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සමස්ත වත්කම් රුපියල් බිලියන 90.8ක් දක්වා සියයට 17.1කින් වැඩි වූ අතර, 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම් සතු රජයේ සුරැකුම්පත්වල සමස්ත කළඹ රුපියල් බිලියන 79.7ක් දක්වා සියයට 15.0කින් වර්ධනය විය. ආයෝජන කළඹෙහි සිදු වූ ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2020 වසරේ අගෝස්තු මස අවසන් වන විට ප්‍රතිමිලදීගැණුම් යටතේ ණය ගැනීම් රුපියල් බිලියන 69.1ක් දක්වා සියයට 14.6කින් වර්ධනය විය.

- **ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ලාභදායීත්වය වැඩි විය.** වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය මඟින් ගණනය කරන ලද ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ලාභදායීත්වය, 2020 අගෝස්තු මාසයෙන් අවසාන වන මාස අට තුළ දී පිළිවෙළින් සියයට 10.5ක සහ සියයට 41.9ක අගයක පැවතිණි. 2019 වසරේ පළමු මාස අට අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 3.7ට සාපේක්ෂව, 2020 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම් රුපියල් බිලියන 6.3ක ලාභයක් වාර්තා කරන ලදී.

8

**8.3 සංඛ්‍යා සටහන**
**ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල තෝරාගත් දර්ශක**

| අයිතම | 2018 අගෝ. අවසානයට | 2019 අගෝ. අවසානයට | 2019 දෙසැ. අවසානයට | 2020 අගෝ. අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2019 අගෝ. | 2020 අගෝ. (අ) |
| **මුළු වත්කම් (රු. බිලියන)** | **73.9** | **79.8** | **77.5** | **90.8** | **8.0** | **13.8** |
| සමස්ත කළඹ (රු. බිලියන) | 67.3 | 73.7 | 69.3 | 79.7 | 9.4 | 8.2 |
| මුළු ප්‍රාග්ධනය (රු. බිලියන) | 11.9 | 14.4 | 15.2 | 18.0 | 20.6 | 24.8 |
| **බදු පෙර ලාභය (රු. බිලියන)** | **1.3** | **3.7** | **4.8** | **6.3** | **180.2** | **69.6** |
| අවදානම් මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) | 22.3 | 23.0 | 27.6 | 26.9 | 0.7 | 3.9 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%) | 2.8 | 6.9 | 5.9 | 10.5 | 4.1 | 3.6 |
| **හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (%)** | **13.9** | **33.1** | **27.3** | **41.9** | **19.2** | **8.8** |
| **තෝලන කාලය** | **5.1** | **4.4** | **4.0** | **3.8** | **- 12.5** | **- 13.2** |
| මෙහෙයුමේ පිරිවැය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 11.6 | 7.0 | 8.1 | 11.0 | - 4.6 | 4.0 |
| මුළු පිරිවැය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 31.8 | 13.4 | 16.2 | 15.9 | - 18.3 | 2.4 |
| **ගළපන ලද කාල සීමාව (Modified Duration)** | **2.5** | **2.5** | **3.0** | **2.6** | **2.7** | **0.9** |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: 1. ඉහත දත්ත තුළ එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී එල් සී සහ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් හි දත්ත අඩංගු නොවේ.

2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් වාර්තා කළ රුපියල් බිලියන 3.1ක සමස්ත ප්‍රතිලාභයන්ට (උපලබ්ධි වූ සහ උපලබ්ධි නොවූ) සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී එම අගය රුපියල් බිලියන 6.1ක් දක්වා සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. රජයේ සුරැකුම්පත්වල ඵලදායීතා වක්‍රයේ අඩු වන ප්‍රවණතාවය ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ලාභදායීත්වය සැලකිය යුතු ලෙස වර්ධනය වීමට හේතු වේ.

- **ප්‍රාග්ධනය හිතකර මට්ටම්වල පවත්වා ගන්නා ලදී.** 2020 වසරේ අගෝස්තු අවසානය වන විට සියලු ප්‍රාථමික අලෙවිකාර සමාගම්[2] සිය ප්‍රාග්ධන මට්ටම අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රුපියල් බිලියන 1.0ට වඩා ඉහළ අගයක පවත්වා ගන්නා ලදී. ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල බර තබන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය එහි අවම අගය වන සියයට 10.0ට වඩා වැඩි අගයක පවත්වා ගත් අතර 2019 වසරේ අගෝස්තු අවසානය වන විට පැවති සියයට 23.0ට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු අවසානය වන විට සියයට 26.9ක් දක්වා වැඩි විය.

- **අවදානම් ව්‍යුහය වැඩිදියුණු විය.** වෙළඳ කළඹ සමස්ත ආයෝජන කළඹට දරණ අනුපාතය, 2019 වසරේ අගෝස්තු මස අවසානයේ දී පැවති සියයට 83.3 සිට 2020 අගෝස්තු මස අවසානයේ දී සියයට 83.6 දක්වා සුළු වශයෙන් වැඩි වීමක් දැක්වූ අතර, ඒ අනුව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී වෙළඳපොළ අවදානම සඳහා නිරාවරණය වීම සමස්තයක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. ප්‍රාථමික අලෙවිකරුවන් විසින් රඳවා ගන්නා අවදානම් රහිත රජයේ සුරැකුම්පත් විශාල ප්‍රමාණය සහ අනපේක්ෂිත ද්‍රවශීලතා පරතර පියවා ගැනීම සඳහා එම රජයේ සුරැකුම්පත් සුරැකුමක් ලෙස භාවිතා කිරීමට ඔවුන්ට ඇති හැකියාව සැලකීමේ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ද්‍රවශීලතා අවදානම් පැතිකඩ අඩු අගයක පැවතිණි. තවද, යම් ද්‍රවශීලතා පරතරයක් ඇති වුවහොත් ඒ පියවා ගැනීම සඳහා අනපේක්ෂිත මූල්‍ය අවශ්‍යතා සඳහා සැලසුම් බොහෝ ප්‍රාථමික අලෙවිකාර සමාගම් සතුව පැවතිණි.

## රක්ෂණ අංශය

- **සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රක්ෂණ අංශයේ සමස්ත කාර්යසාධනය මන්දගාමී විය.** 2020 වසරේ ජූනි මස අවසානය වන විට 2019 ජූනි මාසයට සාපේක්ෂව රක්ෂණ අංශයේ සමස්ත වත්කම් සියයට 13.0කින් වර්ධනය වූ අතර 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා කළ වත්කම්වල සියයට 14.9ක වර්ධනය සැලකීමේදී මෙය සුළු අඩු වීමකි. 2020 වසරේ ජූනි මස අවසානයේ දී දළ ලියාපදිංචි වාරිකයේ වර්ධනය සියයට 2.8ක සෘණ අගයක් ගත් අතර, එය 2019 වසරේ ජූනි මස අවසානයේ වාර්තා වූ සියයට 14.1ක වර්ධනයට සාපේක්ෂව සැලකිය යුතු අඩු වීමකි. දිගුකාලීන රක්ෂණ අංශයේ දළ ලියාපදිංචි වාරිකය 2020 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 3.8කින් ඉහළ ගිය අතර සාමාන්‍ය රක්ෂණ අංශයේ දළ ලියාපදිංචි වාරිකය සියයට 7.7කින් අඩු විය. සාමාන්‍ය රක්ෂණ අංශයේ උප අංශ සලකා බලන විට, 2020 වසරේ ජූනි මස අවසානය වන විට සෞඛ්‍ය

2 පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් සහ එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී එල් සී හැර ප්‍රාථමික අලෙවිකාර සමාගම්

8

8.4 සංඛ්‍යා සටහන

**රක්ෂණ අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2018 ජූනි අවසානයට | 2019 ජූනි අවසානයට | 2019 දෙසැ. අවසානයට | 2020 ජූනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2019 ජූනි | 2020 ජූනි (අ) |
| මුළු වත්කම් (රු. බිලියන) | **581.8** | **668.3** | **691.4** | **755.2** | **14.9** | **13.0** |
| මුළු ආදායම (රු. බිලියන) (ආ) | **108.1** | **123.8** | **251.8** | **120.8** | **14.5** | **- 2.3** |
| දළ වාරික ආදායම (රු. බිලියන) (ආ) | 85.8 | 97.9 | 196.8 | 95.1 | 14.1 | - 2.8 |
| ආයෝජන ආදායම (රු. බිලියන) (ආ) | 22.3 | 25.9 | 55.2 | 25.7 | 15.7 | - 0.5 |
| බදු පෙර ලාභය (රු. බිලියන) (ආ) | **21.7** | **13.7** | **27.8** | **18.2** | **- 36.8** | **32.7** |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 310.3 | 293.0 | 298.0 | 308.0 | | |
| සාමාන්‍ය රක්ෂණය | 179.5 | 203.0 | 231.0 | 238.0 | | |
| රඳවා ගැනීමේ අනුපාතය (%) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 96.0 | 96.1 | 95.8 | 95.1 | | |
| සාමාන්‍ය රක්ෂණය | 76.1 | 78.5 | 83.0 | 75.9 | | |
| හිමිකම් අනුපාතය (%) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 44.2 | 42.0 | 45.6 | 40.6 | | |
| සාමාන්‍ය රක්ෂණය | 63.7 | 64.6 | 67.4 | 47.2 | | |
| ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය (%) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 98.0 | 92.9 | 96.0 | 88.2 | | |
| සාමාන්‍ය රක්ෂණය | 101.4 | 101.4 | 105.3 | 87.3 | | |
| වත්කම් මත ප්‍රතිලාභය (%) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 8.5 | 2.6 | 3.9 | 3.2 | | |
| සාමාන්‍ය රක්ෂණය | 5.1 | 5.8 | 6.1 | 7.7 | | |
| හිමිකම් මත ප්‍රතිලාභය (%) - සාමාන්‍ය රක්ෂණය | **10.4** | **12.0** | **12.3** | **16.2** | | |
| ප්‍රාරක්ෂණ අනුපාතය (%) - සාමාන්‍ය රක්ෂණය | **18.0** | **17.9** | **14.7** | **33.3** | | |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ

මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

හා සමුද්‍ර රක්ෂණ උප අංශ දෙකෙහිම දළ ලියාහළ වාරිකය සියයට 10.6ක ඍණාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී මෝටර් රථ රක්ෂණ හා ගිනි රක්ෂණ උප අංශවල දළ ලියාහළ වාරිකය පිළිවෙළින්, සියයට 3.8ක හා සියයට 1.0ක පහත වැටීමක් වාර්තා කරන ලදී.

- **සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රක්ෂණ අංශයේ ලාභය ඉහළ ගියේය.** 2020 වසරේ ජූනි මස අවසානය වන විට මෙම අංශයේ සමස්ත ලාභය සියයට 32.7කින් ඉහළ යන ලදී. රක්ෂණ අංශයේ ලාභයෙන් සියයට 61.2ක දායකත්වයක් දැක් වූ දිගු කාලීන රක්ෂණ අංශයේ ලාභය මෙම කාලය තුළ දී අඛණ්ඩව පහත වැටුණු අතර 2020 වසරේ ජූනි මස අවසානයේ දී සියයට 20.6ක අඩු වීමක් වාර්තා කරන ලදී. මේ අතර, දෙවන කාර්තුවේ හිමිකම් පෑම් අඩු වීමත් සමගම මෙම කාලපරිච්ඡේදය තුළ දී සාමාන්‍ය රක්ෂණ අංශයේ ලාභය සියයට 116.6කින් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී.

- **මෙම කාලපරිච්ඡේදය තුළ දී සාමාන්‍ය රක්ෂණ අංශයේ හිමිකම් පෑම්වල අගයෙහි සියයට 28.2ක අඩු වීමක් දක්නට ලැබුණු අතර, දිගුකාලීන රක්ෂණ අංශයේ හිමිකම් පෑම්වල අගය සියයට 0.7කින් සුළු වශයෙන් පහත වැටුණි.** 2020 වසරේ දෙවන කාර්තුවේ දී, කොවිඩ්-19 වසංගතය නිසා තාවකාලිකව රට අගුළු දැමීම හේතුවෙන්, රක්ෂණවලින් ආවරණය කරන සිදු වීම් අඩු වීම නිසා හිමිකම් පෑම්වල පහළ යෑමක් නිරීක්ෂණය කරන ලදී. 2020 වසරේ ජූනි මස අවසානය වන විට මෙම අංශයේ ආයෝජන ආදායම සියයට 0.5කින් සුළු වශයෙන් පහළ යන ලදී.

## ඒකක භාර

- **සලකා බලන කාල පරිච්ඡේදය තුළ දී ඒකක භාර අංශයේ කාර්යසාධනය සමස්ත වර්ධනයක් පෙන්නුම් කරන ලදී.** 2020 වසරේ ජූනි මස අවසානය වන විට ඒකක භාර සංඛ්‍යාව 03කින් අඩු වුව ද, මුළු ඒකක හිමියන්ගේ සංඛ්‍යාව 2019 වසරේ ජූනි මස අවසානය වන විට පැවති 44,224ක සිට 2020 වසරේ ජූනි මස අවසානය වන විට 47,903ක් දක්වා ඉහළ යන ලදී. ඒකක භාරවල ශුද්ධ වත්කම් වටිනාකම 2019 වසරේ ජූනි මස අවසානයේ සිට 2020 වසරේ ජූනි මස අවසානය දක්වා සියයට 50.7කින් ඉහළ ගිය අතර ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් බිලියන 113.4ක් ලෙස වාර්තා විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රජයේ සුරැකුම්පත්වල ආයෝජන සියයට

**8.5 සංඛ්‍යා සටහන**
**ඒකක භාර අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2018 ජූනි අවසානයට | 2019 ජූනි අවසානයට | 2019 දෙසැ. අවසානයට | 2020 ජූනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2019 ජූනි | 2020 ජූනි (අ) |
| සමස්ත වත්කම් (රු. බිලියන) | 64.8 | 75.5 | 104.9 | 114.4 | 16.5 | 51.6 |
| ශුද්ධ වත්කම් වටිනාකම (රු. බිලියන) | 64.6 | 75.2 | 104.8 | 113.4 | 16.4 | 50.7 |
| ආයෝජන (රු. බිලියන) | 64.8 | 75.3 | 104.8 | 114.4 | 16.3 | 51.9 |
| කොටස්වල | 11.1 | 8.0 | 9.8 | 8.1 | - 27.4 | 0.7 |
| රජයේ සුරැකුම්පත්වල | 5.3 | 4.0 | 4.0 | 8.6 | - 24.4 | 115.1 |
| වෙනත් (උදා: වාණිජ පත්‍ර, ණයකර, භාරකාර සහතික පත්‍ර සහ බැංකු තැන්පතු) | 48.4 | 63.3 | 91.0 | 97.7 | 30.8 | 54.4 |
| කොටස්වල ආයෝජනය ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 17.2 | 10.7 | 9.4 | 7.2 | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 8.2 | 5.3 | 3.8 | 7.5 | | |
| වෙනත් ආයෝජනයන් ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 74.9 | 84.1 | 86.9 | 86.1 | | |
| මුළු ඒකක හිමිකරුවන්ගේ සංඛ්‍යාව | 41,200 | 44,224 | 46,481 | 47,903 | | |
| ඒකක නිකුතුන් ගණන (බිලියන) | 2.0 | 3.6 | 4.8 | 5.4 | | |
| ඒකක භාර සංඛ්‍යාව | 79 | 75 | 71 | 72 | | |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා ඒකක භාර සංගමය
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

115.1කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, කොටස් සහ අනෙකුත් සුරැකුම්පත්වල ආයෝජන පිළිවෙළින් සියයට 0.7කින් හා සියයට 54.4කින් ඉහළ යන ලදී.

## කොටස් තැරැව්කාර සමාගම් අංශය

- **2020 වසරේ ජූනි මස අවසානය වන විට කොටස් තැරැව්කරුවන්ගේ අංශයේ සමස්ත කාර්යසාධනයේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී.** 2020 වසරේ ජූනි මස අවසානයේ දී, කොටස් තැරැව්කරුවන්ගේ ආදායම රුපියල් මිලියන 443ක් ලෙස වාර්තා කරමින් සියයට 84.9කින් ඉහළ යන ලදී. ඒ අනුව, 2019 වසරේ පළමු භාගය තුළ දී ලැබූ රුපියල් මිලියන 184.1ක අලාභය යථා තත්ත්වයට පත් කරමින්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී මෙම අංශය රුපියල් මිලියන 157.9ක ලාභයක් වාර්තා කරන ලදී. මෙම කාලසීමාව තුළ දී මෙම අංශයේ ශුද්ධ ප්‍රාග්ධනය සියයට 1.5කින් සුළු වශයෙන් ඉහළ යන ලදී.

## විශ්‍රාම අරමුදල්

- **ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම අරමුදල වන සේවක අර්ථසාධක අරමුදලේ වත්කම් පදනම 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් ට්‍රිලියන 2.7 ඉක්මවීය.** සේවක අර්ථසාධක අරමුදලෙහි සමස්ත සාමාජික ගිණුම් ප්‍රමාණය 2019 වසරේ දෙසැම්බර් මස වන විට පෙර වසරට සාපේක්ෂව සියයට 3.7ක වර්ධනයක් වාර්තා කරමින් මිලියන 19.4ක් දක්වා ඉහළ ගියේය.

- **පසුගිය වසරේ පළමු මාස අට සමඟ සසඳන කල 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී සමස්ත දායක මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 99.5ක් දක්වා සියයට 4.9කින් අඩු වූ අතර, ප්‍රතිලාභ ආපසු ගෙවීම් රුපියල් බිලියන 73.8ක් දක්වා සියයට 13.8කින් අඩු විය.** දායක මුදල් හා ප්‍රතිලාභ ආපසු ගෙවීම්වල මෙම පහත වැටීමට මන්දගාමී ආර්ථික ක්‍රියාකාරකම් හේතු විය. ඒ අනුව, අදාළ කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ දායකත්ව මුදල් ලැබීම් ප්‍රමාණය (දායකත්ව මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) රුපියල් බිලියන 25.7ක් විය.

**8.6 සංඛ්‍යා සටහන**
**කොටස් තැරැව්කාර සමාගම් අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2018 ජූනි අවසානයට | 2019 ජූනි අවසානයට | 2019 දෙසැ. අවසානයට | 2020 ජූනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2019 ජූනි | 2020 ජූනි (අ) |
| මුළු වත්කම් (රු. බිලියන) | 10.5 | 7.5 | 9.7 | 13.5 | - 27.9 | 78.4 |
| මුළු වගකීම් (රු. බිලියන) | 5.0 | 2.5 | 4.5 | 8.4 | - 49.5 | 232.7 |
| ශුද්ධ ප්‍රාග්ධනය (රු. බිලියන) | 5.5 | 5.0 | 5.1 | 5.1 | - 8.4 | 1.5 |
| ආදායම (රු. මිලියන) (ආ) | 384.6 | 239.6 | 574.0 | 443.0 | - 37.7 | 84.9 |
| බදු පෙර ශුද්ධ ලාභය/ (අලාභය) (රු. මිලියන) (ආ) | - 57.9 | - 184.1 | 88.0 | 157.9 | 218.2 | -185.8 |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ

මූලය: ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**8.7 සංඛ්‍යා සටහන**

**සේවක අර්ථසාධක අරමුදලෙහි තෝරාගත් දර්ශක**

| අයිතම | 2019 අගෝ. අවසානයට | 2020 අගෝ. අවසානයට (අ) | වෙනස (%) |
|---|---|---|---|
| මුළු දායකත්වය (රු. බිලියන) (ආ) | 104.6 | 99.5 | - 4.9 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) (ආ) | 85.6 | 73.8 | - 13.8 |
| මුළු වත්කම් (රු. බිලියන) | 2,477.9 | 2,714.4 | 9.5 |
| මුළු ආයෝජන කළඹ (රු. බිලියන) | 2,471.9 | 2,711.9 | 9.7 |
| එයින් රජයේ සුරැකුම්පත් (%) | 94.7 | 93.8 | - 0.9 |
| දළ ආදායම (රු. බිලියන) (ආ) | 159.4 | 172.6 | 8.3 |

(අ) තාවකාලික
(ආ) අදාළ වර්ෂයේ පළමු මාස අට තුළ

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.8 සංඛ්‍යා සටහන**

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි තෝරාගත් දර්ශක**

| අයිතම | 2019 ජූනි අවසානයට | 2020 ජූනි අවසානයට (අ) | වෙනස (%) |
|---|---|---|---|
| මුළු දායකත්වය (රු. බිලියන) (ආ) | 13.4 | 13.2 | - 1.5 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) (ආ) | 10.4 | 8.5 | - 18.3 |
| මුළු වත්කම් (රු. බිලියන) | 327.7 | 362.7 | 10.7 |
| මුළු ආයෝජන කළඹ (රු. බිලියන) | 308.3 | 342.2 | 11.0 |
| එයින් රජයේ සුරැකුම්පත් (%) | 77.8 | 81.8 | 5.1 |
| දළ ආදායම (රු. බිලියන) (ආ) | 15.9 | 16.9 | 6.1 |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ

මූලය: සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

- **සේවක අර්ථසාධක අරමුදලේ සමස්ත වත්කම් ප්‍රමාණය 2020 වසරේ අගෝස්තු 31 දිනෙන් අවසන් වන මාස 12ක කාලපරිච්ඡේදය සඳහා රුපියල් බිලියන 2,714 දක්වා සියයට 9.5කින් වර්ධනය විය.** සේවක අර්ථසාධක අරමුදලේ සමස්ත ආයෝජනයන්හි වටිනාකම ද සියයට 9.7කින් වර්ධනය වූ අතර, එය 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 2,712ක් විය. මෙම ආයෝජන කළඹෙහි සංයුතිය සියයට 93.8ක් රාජ්‍ය සුරැකුම්පත්වලින් ද, සියයට 2.3ක් ව්‍යාපාර කොටස්වලින් ද, සියයට 1.5ක් සාංගමික ණය උපකරණ, භාරකාර සහතික පත් සහ ප්‍රතිවිකුණුම්වලින් සමන්විත වූ අතර, සියයට 2.4ක් ස්ථාවර තැන්පතුවලින් ද සමන්විත විය. 2020 ජනවාරි සිට අගෝස්තු මස දක්වා කාලය සඳහා අරමුදලෙහි ඇස්තමේන්තුගත දළ ආයෝජන ආදායම රුපියල් බිලියන 172.6ක් ලෙස වාර්තා වූ අතර, 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදය සමඟ සසඳන කළ මෙය සියයට 8.3ක වර්ධනයකි.

- **2019 වසරේ සාමාජිකයන් සඳහා ගෙවූ පොලී අනුපාතිකය සියයට 9.25ක් වූ අතර, 2018 වසරේ පොලී අනුපාතිකය සියයට 9.50ක් විය.** 2020 වසර තුළ වෙළඳපොළ පොලී අනුපාතිකයේ සැලකිය යුතු අඩු වීමක් දක්නට ඇති බැවින් 2020 වසර සඳහා 2019 වසරට සාපේක්ෂව සමාන හෝ සුළු අඩු වීමක් සහිත ප්‍රතිලාභ අනුපාතිකයක් ලබා දීමට හැකි වෙතැයි අපේක්ෂා කරයි. අරමුදලේ ආයෝජනයන්ගෙන් සියයට 90කට වැඩි ප්‍රතිශතයක් රාජ්‍ය සුරැකුම්පත්වලින් සමන්විත වේ. ඒ අනුව, අනාගත වෙළඳපොළ පොලී අනුපාතිකයන්ගේ අඩු වීමක් මගින් මැදි කාලීනව ආයෝජන ප්‍රතිලාභයන්ට සැලකිය යුතු බලපෑමක් ඇති විය හැක.

- **සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වත්කම් පදනම අනුව වර්ධනය වූ අතර, දායකත්වය අතින් ගත් කළ සුළු වශයෙන් සංකෝචනය විය.** මෙම අරමුදලෙහි මුළු වත්කම් රුපියල් බිලියන 367.2ක අගයක් වාර්තා කරමින් සියයට 10.7කින් වර්ධනය විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී දායක මුදල් රුපියල් බිලියන 13.2ක් ලෙස වාර්තා කරමින් සියයට 1.5කින් සුළු වශයෙන් අඩු විය. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි ආයෝජනවලින් රජයේ සුරැකුම්පත්වල සිදු කළ ආයෝජනය මුළු ආයෝජන කළඹෙන් සියයට 81.8ක ඉහළම දායකත්වයක් වාර්තා කරන ලදී. 2020 වසරේ ජූනි මස අවසන් වන විට අරමුදලේ ස්ථාවර තැන්පතුවල ආයෝජන සහ ව්‍යාපාර කොටස්වල ආයෝජන සමස්ත ආයෝජන කළඹෙන් පිළිවෙළින් සියයට 13.0ක් හා සියයට 3.3ක් විය.

- **2020 වසරේ ජූනි මස අවසානයේ දී රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සමස්ත වත්කම් හා සාමාජික සංඛ්‍යාව අනුව වර්ධනයක් පෙන්නුම් කළ ද, ශුද්ධ දායක මුදලෙහි අඩු වීමක් පෙන්නුම් කරන ලදී.** අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයන් ගණන 2019 වසරේ ජූනි මස අවසානය වන විට වාර්තා කළ 230,414ට සාපේක්ෂව 2020 වසරේ ජූනි මස අවසානය වන විට 233,534ක් දක්වා ඉහළ යන ලදී. 2020 වසරේ ජූනි මස අවසානය වන විට අරමුදලේ සමස්ත වත්කම් බිලියන 71.8ක් දක්වා සියයට 14.6කින් වර්ධනය වූ අතර, අරමුදලේ ආයෝජන රුපියල් බිලියන 67.0ක් දක්වා සියයට 14.0කින් ඉහළ ගියේය. රජයේ සුරැකුම්පත්වල ආයෝජන, අරමුදලේ සමස්ත ආයෝජනවලින් සියයට 27.7කි. අරමුදලේ ශුද්ධ දායකත්වය 2019 වසරේ ජූනි මස අවසානයේ දී පැවති රුපියල් මිලියන 240.3ට සාපේක්ෂව 2020 වසරේ ජූනි මස අවසානය වන විට රුපියල් මිලියන 155.5ක් දක්වා අඩු විය. මීට ප්‍රධානතම හේතුව වූයේ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දායක මුදල් ලැබීම ප්‍රමාද වීමයි. මෙම කාලය තුළ සාමාජික මුදල් ශේෂයන් මත ප්‍රතිලාභ අනුපාතය සියයට 9.8ක් විය.

## මූල්‍ය වෙළඳපොළ සංවර්ධනයන්

### දේශීය මුදල් වෙළඳපොළ

- **2019 වසරේ සැප්තැම්බර් මස මැද භාගයේ සිට අතිරික්ත මට්ටමක පැවති වෙළඳපොළ ද්‍රවශීලතාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මෙහෙයුම් කටයුතු සහ අනෙකුත් සාධක රාශියක බලපෑම හේතුවෙන්, 2020 වසර තුළ ද තවදුරටත් අතිරික්තයක පැවතුණි.** මෙම අතිරික්ත ද්‍රවශීලතාව සඳහා බලපෑ අනෙකුත් සාධක වනුයේ, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව අඩු කිරීම, මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලට ගැනීම, විදේශ විනිමය ආශ්‍රිත ගනුදෙනු සහ කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතු කොටගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දුන් විශේෂ ණය යෝජනා ක්‍රම යටතේ ලබා දුන් අරමුදල් යනාදියයි. මුදල් වෙළඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාවක් පැවති බැවින්, 2020 වසරේ පළමු කාර්තුව තුළ දී වර්තමාන මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍යයෙහි පවත්වා ගැනීමේ අරමුණ ඇතිව මහ බැංකුව විසින් ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වා දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරන ලදී. වෙළඳපොළ ණය පොලී අනුපාතික අඛණ්ඩව පහළ මට්ටමක පවත්වා ගැනීමට සහාය වීම සඳහා, 2020 වසරේ මුල් භාගයේ දී, මහ බැංකුව විසින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි පහළ සහ ඉහළ සීමා වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, පදනම් අංක 50කින් සියයට 6.50 සහ සියයට 7.50 දක්වා අඩු කරන ලදී.

- **තවද, කොවිඩ්-19 වසංගත කාලය තුළ දී වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වා ගැනීම තහවුරු කිරීම සහ කෙටිකාලීන පොලී අනුපාතික මත ඇති විය හැකි අනවශ්‍ය පීඩනය වළක්වාලීමේ අරමුණු ඇතිව, 2020 වසරේ මාර්තු මස මැද සිට බලපැවැත්වෙන පරිදි මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී.** ඒ අනුව, 2020 වසරේ මාර්තු 17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පොලී අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.25 සහ සියයට 7.25 දක්වා පදනම් අංක 25කින් අඩු කරන ලදී. දේශීය මුදල් වෙළඳපොළ සඳහා රුපියල් බිලියන 65ක පමණ ද්‍රවශීලතාවක් මුදා හරිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 2020 වසරේ මාර්තු 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිශතාංක 1.00කින් සියයට 4.00 දක්වා අඩු කරන ලදී. 2020 මාර්තු මස අවසානයේ සිට ජූනි දක්වා කාල සීමාව තුළ දී වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාවක් පැවතුණ ද වෙළඳපොළ සහභාගීත්ව ආයතන අතර ද්‍රවශීලතාව බෙදී යාමේ අසමතුලිතතාවක් පැවතීම මෙන්ම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වාගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් දින, කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම මගින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මාස තුනක කාලයක් දක්වා වූ දිගුකාලීන ද්‍රවශීලතා පහසුකම ලබා දෙන ලදී. මේ අතරම, ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ද දින 15ක් දක්වා දීර්ඝ කරන ලද කාලසීමාවක් සඳහා දිගුකාලීන ද්‍රවශීලතා පහසුකම ලබාදෙන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අහිතකර බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් වෙත තවදුරටත් සහන සැලසීමේ ක්‍රියාමාර්ගයක් ලෙස 2020 වසරේ අප්‍රේල් 03 ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.00 සහ සියයට 7.00 දක්වා පදනම් අංක 25කින් තව දුරටත් පහත හෙළන ලදී.


- **මීට අමතරව, ද්‍රවශීලතා කළමනාකරණය වඩාත් නම්‍යශීලී කරනු පිණිස, 2020 වසරේ අප්‍රේල් මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගත යා යුතු අවම දෛනික සංචිත අවශ්‍යතාව සියයට 90 සිට සියයට 20 දක්වා පහත හෙළන ලදී.** එමෙන්ම 2020 වසරේ අප්‍රේල් මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි හදිසි මූල්‍ය දුෂ්කරතාවක දී මූල්‍ය ආයතනවලට භාවිතා කළ හැකි සහ පරිපාලනමය වශයෙන් තීරණය කරනු ලබන බැංකු අනුපාතිකය, සියයට 15 සිට සියයට 10 දක්වා පදනම් අංක 500කින් පහත හෙලන ලද අතර, එම අනුපාතිකය නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට පදනම් අංක 300ක ආන්තිකයක් එකතු කොට නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයෙහි වෙනස්වීම්වලට අනුකූලව වෙනස් වීමට ඉඩ හරින ලදී. මූල්‍ය පද්ධතිය හරහා ආර්ථිකයේ අවශ්‍ය අංශ වෙත ණය දීම කඩිනම්ව සිදු කිරීම උනන්දු කිරීම

සඳහා පොලී අනුපාතික තවදුරටත් පහළට නැඹුරු කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, 2020 වසරේ මැයි 06 දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත්, පිළිවෙළින්, සියයට 5.50 සහ සියයට 6.50 දක්වා පදනම් අංක 50කින් අඩු කරන ලද අතර, 2020 වසරේ ජූලි 09 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එම අනුපාතික, පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 දක්වා තවදුරටත් පදනම් අංක 100කින් අඩු කරන ලදී.

- **තවද, දේශීය මුදල් වෙළඳපොළ වෙත රුපියල් බිලියන 115ක පමණ අතිරේක අරමුදල් ප්‍රමාණයක් මුදා හරිමින් 2020 වසරේ ජූනි මස 16 වන දින ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සියයට 4.00 සිට සියයට 2.00 දක්වා තවදුරටත් පදනම් අංක 200කින් අඩු කරන ලදී.** මීට සමගාමීව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ගණනය කිරීමේ දී සලකා බලනු ලබන කාසි හා නෝට්ටු වශයෙන් තබාගන්නා ප්‍රමාණය අනුව, ඊට සිදු කළ හැකි ගැලපුම සියයට 2 සිට සියයට 1 දක්වා අඩු කරන ලදී. දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති අතිරික්ත ද්‍රවශීලතා තත්ත්වය හේතු කොටගෙන 2020 වසරේ ජූනි මස 17 වැනි දින සිට 2020 වසරේ සැප්තැම්බර් මස 24 වැනි දින දක්වා කාලය අතර වෙළඳපොළ තුළ වෙන්දේසි නොපවත්වන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම හරහා බලපත්‍රලාභී වාණිජ බැංකු සිය අතිරික්ත ද්‍රවශීලතාව අඛණ්ඩව මහ බැංකුවේ තැන්පත් කිරීමට පෙළඹුණු බැවින් මහ බැංකුව විසින් මුදල් වෙළඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාව එක් දින පදනමින් නිත්‍ය පහසුකම හරහා අවශෝෂණය කරන ලදී. මුදල් වෙළඳපොළ තුළ ප්‍රමාණවත් අතිරික්ත ද්‍රවශීලතාවක් පැවතිය ද, විදේශ ණය ගෙවීම් හමුවේ ද්‍රවශීලතාව අඩු වීමේ අපේක්ෂාව මෙන්ම, ප්‍රමාණවත් ද්‍රවශීලතාව දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවතීමේ අවශ්‍යතාවය ද සැලකිල්ලට ගනිමින් 2020 වසරේ සැප්තැම්බර් මස 25 වන දින සිට විවට වෙළඳපොළ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම් වෙන්දේසි සිදු කිරීම නැවත ආරම්භ කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දිගුකාලීන හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි මෙන්ම, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ වන වෙන්දේසි, අවශ්‍යතාව අනුව පවත්වන ලදී.

**8.15 රූප සටහන**

**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ වෙළඳපොළ ද්‍රවශීලතාව**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **2020 වසරේ මැයි මස දක්වාම නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ මධ්‍යයෙහි පැවති ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි එක් දින ගනුදෙනු මත පදනම් වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග හමුවේ නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි පහළ සීමාව දක්වා ක්‍රමයෙන් අඩු විය.** 2020 වසරේ පළමු භාගයේ දී, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය බොහෝවිට නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍යයට ආසන්නව පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සමත් විය. 2020 වසරේ ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව පදනම් අංක 100කින් අඩු කිරීමට අනුකූලව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ද ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමේ සමස්ත බලපෑම සම්ප්‍රේෂණය වීම පෙන්නුම් කරමින් අඩු විය. ඉහළ අතිරික්ත ද්‍රවශීලතාවයක් පැවතීම හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව ක්‍රියාත්මක වීම තුළින් ආර්ථික කටයුතු නැංවීම සඳහා ණය පොලී අනුපාතික අඩු කිරීමේ අරමුණ ඇතිව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි පහළ සීමාව දක්වා පහළ යෑමට ඉඩ සලසන ලදී. 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සියයට 4.53ක් විය. ප්‍රතිමිලදීගැනුම් වෙළඳපොළතුළබැංකුනොවනප්‍රාථමිකඅලෙවිකරුවන් කිහිප දෙනෙකු විසින් ඉහළ පොලී අනුපාතික යටතේ

ණය ලබාගැනීම හේතු කොටගෙන 2020 වසරේ සැප්තැම්බර් හා ඔක්තෝබර් මස මුල් භාගයේ දී බරිත සාමාන්‍ය වෙළඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය යම් ඉහළ යැමක් පෙන්නුම් කළ ද, සමස්තයක් ලෙස ගත් කල, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය හා ආසන්න මට්ටමක පැවතිණි. 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට, බරිත සාමාන්‍ය වෙළෙඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 4.58ක් විය.


- **මූල්‍ය පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කරමින් අඩු පොලී අනුපාතිකයක් පවත්වා ගැනීමට පෙළඹවීම සඳහා දේශීය මුදල් වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වාගෙන යෑම, කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී මහ බැංකුවේ අරමුණ විය.** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොවිඩ්-19 වසංගත තත්ත්වය පැවති කාලසීමාව තුළ දී විශේෂ ද්‍රවශීලතා අවශ්‍යතා සහිත අංශ වෙත ණය සැපයීම සඳහා 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 83(1) වන වගන්තිය යටතේ නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, රජයේ කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීම සහතික කිරීම සඳහා රජය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපි හා වාණිජ බැංකු විසින් නිකුත් කළ පොරොන්දු නෝට්ටු මත පදනම් වෙමින් රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ හා සැපයුම්කරුවන් සඳහා සියයට 4.00 නොඉක්මවූ පොලී අනුපාතිකයක් යටතේ දින 180ක කාලසීමාවක් සඳහා ණය ලබා දීමට, මහ බැංකුව විසින් සියයට 1.00 ක සහනදායී පොලී අනුපාතිකයකට බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ද්‍රවශීලතා පහසුකමක් හඳුන්වා දෙන ලදී. 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට මෙම ණය පහසුකම යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මුදාහරින ලද අරමුදල් ප්‍රමාණය රුපියල් බිලියන 4.5ක් විය. ඊට අමතරව, සෞභාග්‍යා පුනරුද සහන ණය යෝජනා ක්‍රමයෙහි දෙවන අදියර යටතේ දේශීය ව්‍යාපාර සඳහා සියයට 4.00 නොඉක්වූ පොලී අනුපාතිකයකට ණය ලබාදීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පුළුල් පරාසයක ඇප සුරැකුම් යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සියයට 1.00ක සහනදායී පොලී අනුපාතිකයකට අරමුදල් සපයන ලදී. 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට සෞභාග්‍යා පුනරුද සහන ණය යෝජනා ක්‍රමයෙහි දෙවන අදියර යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මුදා හරින ලද අරමුදල් ප්‍රමාණය රුපියල් බිලියන 51.0කි.

### දේශීය විදේශ විනිමය වෙළඳපොළ

- **2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 2019 දෙසැම්බර් මාසය අවසානයේ දී පැවති රුපියල් 181.63 සිට 2020 සැප්තැම්බර් මාසය අවසානයේ දී වාර්තා වූ රුපියල් 185.52ක් දක්වා සියයට 2.10කින් අවප්‍රමාණය විය.** පශ්චාත් මැතිවරණ ආර්ථික ස්ථායිතාවයත් සමඟ 2020 වසර ආරම්භ වූයේ රුපියල් 181.00ක මට්ටමේ විචලනය වූ ස්ථාවර විනිමය අනුපාතයකින් වූ අතර, එය 2020 වසරේ පෙබරවාරි මාසය අවසානය දක්වා එම මට්ටමේම පැවතුණි. කෙසේ වෙතත්, එම ස්ථායීතාවය දිගු කලක් නොපැවති අතර කොවිඩ්-19 ගෝලීය අර්බුදයේ බලපෑම මත අඩු වූ අපනයන ඉපැයීම්, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ගලා ඒම් සහ අඩු වූ ප්‍රේෂණ මෙන්ම රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙන් සහ කොටස් වෙළඳපොළෙන් විදේශ ආයෝජන ආපසු ගලා යැමත් නිසා විදේශ විනිමය අනුපාතය කෙරෙහි සැලකිය යුතු මට්ටමේ පීඩනයක් මාර්තු මාසයේ මැද භාගයේ සිටම නිරීක්ෂණය වූ අතර එම තත්ත්වය අප්‍රේල් මාසයේ දී විනිමය අනුපාතය රුපියල් 200.00 මට්ටමට අවප්‍රමාණය වීමට හේතු විය. කෙසේ වෙතත්, විනිමය අනුපාතය මත ඇතිවූ මෙම පීඩනය, මහ බැංකුව විසින් එතැන් සහ ඉදිරි වෙළඳපොළ තුළ මධ්‍යස්ථව කරන ලද මැදිහත්වීම් සහ විදේශ විනිමය සංචිත අඩු නොවන පරිදි විදේශ විනිමය ද්‍රවශීලතාවය සැපයීමේ අරමුණින් හඳුන්වා දුන් විකිණීම්-මිළදී ගැනීම් විනිමය හුවමාරු වෙන්දේසි හේතුවෙන් අඩු විය. තවද, අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා තාවකාලික සීමාවන් පැනවීමට රජය සහ මහ බැංකුව විසින්

**8.16 රූප සටහන**

**එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි විචලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ සහ තෝරාගත් බාහිර ප්‍රේෂණ සීමා කිරීම සහ අපේක්ෂිත තත්ත්වයට වඩා ඉහළ ප්‍රේෂණ ගලා ඒම් ද විනිමය අනුපාතයට ඇති වූ පීඩනය අවම කිරීම සඳහා සහාය විය. ඒ අනුව, 2020 වසරේ පළමු භාගය තුළ විනිමය අනුපාතයේ නිරීක්ෂණය වූ අවප්‍රමාණය වීමේ ප්‍රවණතාවය 2020 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට ක්‍රමයෙන් ලිහිල් විය. මේ අතර, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, ඉන්දියානු රුපියලට සහ එක්සත් රාජධානි ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සුළු වශයෙන් අධිප්‍රමාණය වූ අතර, ඔස්ට්‍රේලියානු ඩොලරය, යූරෝ සහ ජපන් යෙන්වලට සාපේක්ෂව අවප්‍රමාණය විය.

- **2020 වසරේ සැප්තැම්බර් 30න් අවසන් කාලපරිච්ඡේදය තුළ දී මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ශුද්ධ ගැණුම්කරුවෙකු විය.** 2020 වසරේ විශේෂයෙන්ම මාර්තු මාසයේ සිට මැයි මාසය මැද භාගය දක්වා අධික විචල්‍යතාවයක් පැවති කාලයේදී මධ්‍යස්ථ විකුණුම් සිදු කල ද, දේශීය විදේශ විනිමය වෙළඳපොළට ලැබුණු ගලාඒම් සහ පහළ ගිය ආනයන ඉල්ලුම හේතුවෙන් විදේශ විනිමය සංචිත ගොඩ නැංවීමේ අරමුණින් මැයි මස අග භාගයේ සිට නැවතත් විදේශ විනිමය වෙළඳපොළෙන් මිලදී ගැනීම ආරම්භ කිරීමට මහ බැංකුවට හැකියාව ලැබුණි. ඒ අනුව, 2020 වසරේ සැප්තැම්බර් අවසානය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ, මහ බැංකුව එ.ජ. ඩොලර් මිලියන 629.0ක් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මිලදී ගත් අතර, එ.ජ. ඩොලර් මිලියන 373.9.ක් විදේශ විනිමය වෙළඳපොළට සපයන ලදී. එහි ප්‍රතිපලයක් වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 255.1ක ශුද්ධ මිලදී ගැනීමක් සිදු විය.


- **2020 වසරේ සැප්තැම්බර් 30න් අවසන් වන කාලපරිච්ඡේදය තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි වෙළඳ පරිමාව පහත වැටිණි.** කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ බලපෑම හේතුවෙන්, 2019 වසරේ සැප්තැම්බර් වලින් අවසන් වන මාස නවය හා සසඳන විට, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී දේශීය විදේශ විනිමය අන්තර් බැංකු වෙළඳපොළෙහි වෙළඳ පරිමාව පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන කල එ.ජ. ඩොලර් බිලියන 13.97ක් දක්වා සියයට 6.0කින් අඩු විය. ඊට අනුරූපව, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ තුළ දෛනික සාමාන්‍ය වෙළඳ පරිමාව 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.4කින්, එ.ජ. ඩොලර් මිලියන 82.98ක සිට එ.ජ. ඩොලර් මිලියන 79.37ක් දක්වා පහළ යන ලදී.

### රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ

- **2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළේ ඵලදා අනුපාතිකයේ ඉතිහාසගත පහත වැටීමක් නිරීක්ෂණය විය.** ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික පහළ යෑමත් සමඟ 2019 වසරේ අනුරූප කාලසීමාවට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය පුරාවටම රජයේ සුරැකුම්පත් සඳහා වූ ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රයෙහි පහත වැටීමක් නිරීක්ෂණය විය. එම ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රයේ පහත වැටීම, වෙළඳපොළ සම්පත්වලට අනුරූපව උපායමාර්ගිකව නිකුත් කිරීමේ වැඩපිළිවෙළ, මහ බැංකුව විසින් අනුගමනය කරන ලද විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ පහළ පාදක පොලී අනුපාතිකයන්ට පහසුකම් සැලසීම සඳහා වූ රජයේ ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශවල ප්‍රතිඵලයක් විය. ඒ අනුව, 2020 වසරේ සැප්තැම්බර් අවසානය වන විට දින 91, දින 182 සහ දින 364 යන භාණ්ඩාගාර බිල්පත්වල ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික 2019 වසර අවසානයට සාපේක්ෂව පිළිවෙළින්, පදනම් අංක 301,

**8.17 රූප සටහන**

**රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පදනම් අංක 324 සහ පදනම් අංක 351කින් පහත වැටී ඇත. මේ අතර, අවුරුදු 2 සිට 8 දක්වා වූ කල්පිරීම් සහිත සක්‍රියව ගනුදෙනු වන භාණ්ඩාගාර බැඳුම්කරවල වෙළඳපොළ ඵලදා අනුපාතික පදනම් අංක 280 සිට 319 පමණ ප්‍රමාණයකින් අඩු විය.

- **කොවිඩ්-19 වසංගත කාලපරිච්ඡේදය ආරම්භයේ සිට, රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික නිකුතු ක්‍රියාවලියේ ඵලදායීතාවයට සහ විනිවිදභාවයට හානියක් නොවන පරිදි මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශවලට අනුකූලව රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළට අදාළව ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යෑම කරන ලදී.** ඒ අනුව, වෙළඳපොළ සහභාගිවන්නන් අතර සමමිතික ආකාරයෙන් තොරතුරු බෙදා හැරීම වැඩිදියුණු කරමින් වඩාත් අවබෝධාත්මකව තීරණ ගැනීම පහසු කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවලදී ඉදිරිපත් කරන ලද සියලුම කල්පිරීම් සඳහා උපරිම ඵලදා අනුපාතිකයන් 2020 මැයි 12 දින සිට බලපැවැත්තවෙන පරිදි වෙළඳපොළ සහභාගිවන්නන්හට වෙන්දේසියට පෙර ප්‍රකාශයට පත් කරන ලදී. තවද, 2020 වසරේ මැයි සිට ජූලි දක්වා කාල සීමාව තුළ මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා සපුරාලීම සඳහා මසකට එක් භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියක් ලෙස පැවති ස්ථාපිත භාවිතයෙන් බැහැරව මසකට වෙන්දේසි වාර දෙක බැගින් පවත්වන ලදී. මේ අතර, අතුරු සම්මත ගිණුම පාදක කර ගනිමින් මූල්‍යකරණ අනුමැතිය ලබා දෙන බැවින් වෙන්දේසි දින දර්ශනය කෙටි කාල සීමා සඳහා පවත්වා ගෙන යනු ලැබීය.

- **2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මගින් සිදු කළ සැලකිය යුතු ප්‍රමාණයක මූල්‍යකරණය මගින් රුපියල් බිලියන 141.6කට වඩා පිරිවැය ඉතිරි කිරීම් සාක්ෂාත් කර ගන්නා ලදී.** එම කාල සීමාව සඳහා රුපියල් බිලියන 2,428.0ක භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමෙන් මූල්‍යකරණය සිදු කර ඇති අතර එමගින් 2019 වසරේ දී එම ණය උපකරණ මගින් සිදු කළ මූල්‍යකරණයේ බර තැබූ සාමාන්‍ය පිරිවැයට සාපේක්ෂව 2020 වසර ඇතුළුව අයවැය මෙහෙයුම් කටයුතුවල සැලකිය යුතු පිරිවැය ඉතිරියක් ළඟාකර ලබා ගැනීමට රජයට හැකි වනු ඇත.

### සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ

- **කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුව ද, 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී වාණිජ පත්‍ර වෙළඳපොළ සාපේක්ෂව ක්‍රියාකාරී විය.** 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී බැංකුවල සහාය ඇතිව නිකුත් කරන ලද වාණිජ පත්‍රවල වටිනාකම රුපියල් බිලියන 3.3ක් වූ අතර, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී එම අගය රුපියල් බිලියන 2.4ක් ලෙස වාර්තා විය. වාණිජ පත්‍රවල පොලී අනුපාතික 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී පැවති සියයට 13.50ත් සහ සියයට 16.25ත් අතර පරාසයක සිට 2020 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සියයට 9.00ත් සහ සියයට 15.50ත් අතර පරාසයක් දක්වා පහත වැටුණි. නිකුත් කරන ලද වාණිජ පත්‍ර අතරින් සියයට 69.2ක් මාස 03ක් දක්වා කල්පිරීම් කාලයක් සහිත වූ අතර, ඉතිරි වාණිජ පත්‍ර මාස 06ක කල්පිරීම් කාලයක් සහිතව නිකුත් වන ලදී. නොපියවූ සමස්ත වාණිජ පත්‍රවල වටිනාකම 2019 වසරේ අගෝස්තු මස අවසානයේ දී පැවති රුපියල් බිලියන 2.2ට සාපේක්ෂව 2020 අගෝස්තු අවසානය වන විට රුපියල් බිලියන 2.1ක් විය.

- **පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී සාංගමික බැඳුම්කර වෙළඳපොළ තුළ පහළ මට්ටමක ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරන ලදී.** කොවිඩ්-19 වසංගත තත්ත්වය සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සති හතක කාලයක් තාවකාලිකව වසා තැබීම, සාංගමික බැඳුම්කර වෙළඳපොළෙහි ක්‍රියාකාරිත්වයට බලපාන ලදී. 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ආයතන 09ක් විසින් ණයකර 17ක් නිකුත් කරන ලද අතර එයට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන කාලපරිච්ඡේදය තුළ දී ආයතන 06ක් විසින් විවිධ ණයකර 12ක් නිකුත් කරන ලදී. ලැයිස්තුගත කරන ලද ආයතනික බැඳුම්කරවල වටිනාකම, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා කළ රුපියල් බිලියන 35.6ට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 16.4ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ යන ලදී. මෙම කාල සීමාව තුළ දී නිකුත් කළ ණයකර 12 අතුරින් ණයකර 02ක් විචල්‍ය පොලී අනුපාතිකයක් සහිතව නිකුත් කරන ලද අතර, ඉතිරි ණයකර ස්ථාවර පොලී අනුපාතික යටතේ නිකුත් කරන ලදී.

සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ණයකරවල ස්ථාවර පොලී අනුපාතික සියයට 9.50ත් සියයට 13.25ත් අතර පරාසයක පැවතුණු අතර එයට සාපේක්ෂව 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී එය සියයට 12.88ත් සියයට 15.50ත් අතර පරාසයක පැවතුණි.

### කොටස් වෙළඳපොළ


- **මැයි මස මැද භාගයේ සිට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව, කොටස් මිල අනුව ගත් කළ යථා තත්ත්වයට පත් වීමේ ලකුණු පෙන්වුව ද, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී, සමස්තයක් ලෙස, කොවිඩ්-19 වසංගතයෙන් හටගත් අවිනිශ්චිතතා හේතුවෙන් පහළ ක්‍රියාකාරිත්වයක් වාර්තා කරන ලදී.** අඩු පොලී අනුපාත තන්ත්‍රය, රට තුළ කොවිඩ්-19 වසංගතය පාලනයට යොදාගත් කාර්යක්ෂම වැඩපිළිවෙල සහ අලුත් වූ දේශපාලන ස්ථාවරත්වය සමඟ විශ්වාසය වැඩි වීම හේතුවෙන්, දේශීය ආයෝජකයින්ගේ කැමැත්ත කොටස් ආයෝජන වෙත මාරුවීමත් සමඟ මෙම දුර්වල ක්‍රියාකාරිත්වය යථා තත්ත්වයට පත් වීම ආරම්භ විය. කෙසේ වෙතත්, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව කොවිඩ්-19 වසංගතය පිළිබඳ අහිතකර පුවත්වලට ඉහළ සංවේදීතාවයක් පෙන්නුම් කරන ලදී.

- **කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් නිර්මාණය වූ වෙළඳපොළ ආතති වාතාවරණය තුළ මෙම කාලපරිච්ඡේදය තුළ දී සමස්ත කොටස් මිල දර්ශකය සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකවල විචලතාවය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 5කට වඩා පහත වැටීම් වාර්තා වීම හේතුවෙන් මාර්තු 10 සිට මාර්තු 20 දක්වා කාලය තුළ දී වෙළඳපොළ විවෘත කරන ලද දිනවල මිනිත්තු 30ක කාලයකට වෙළඳපොළ කටයුතු අත්හිටුවන ලදී. කොවිඩ්-19 වසංගතයේ පැතිරීම වැළැක්වීම සඳහා රජය විසින් පනවනු ලැබූ අගුළු දැමීම හේතුවෙන් 2020 වසරේ මාර්තු 20 වන දින සිට 2020 වසරේ මැයි 11 වන දින දක්වා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව වසා තබන ලදී. සති හතක කාලයක් වසා දැමීමෙන් අනතුරුව නැවත විවෘත කිරීමෙන් පසුව ද, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 5කට වඩා පහත වැටීම හේතුවෙන් මැයි 11 සහ මැයි 12 දෙදින තුළ වෙළඳපොළ කටයුතු නැවතත් අත්හිටුවන ලදී. එතැන් පටන් වෙළඳපොළ යථා තත්ත්වයට පත්වීමේ ලකුණු පෙන්වන ලදී. කෙසේ වුවද, ජූලි 13 සහ ඔක්තෝබර් 05 දින තුළ රට තුළ නව කොවිඩ්-19 පොකුරු හඳුනාගත් සැනින් ඇති වූ වෙළඳපොළ භීතිකාව හේතුවෙන් වෙළඳපොළ දර්ශක සීඝ්‍ර ලෙස පහත වැටුණි.

- **සමස්තයක් ලෙස, 2019 වසර අවසානයට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් අවසානය වන විට සමස්ත කොටස් මිල දර්ශකය සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය පිළිවෙළින් සියයට 2.4කින් සහ සියයට 16.1කින් පහළ යන ලදී.** වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය 2019 වසර අවසානයේ දී පැවති රුපියල් බිලියන 2,851.3ක සිට 2020 වසරේ සැප්තැම්බර්

**8.18 රූප සටහන**


**කොටස් මිල දර්ශකවල විචලනය**




මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

**8.19 රූප සටහන**

**කොළඹ ව්‍යාපාර හුවමාරුවේ විදේශ සහභාගීත්වය**




මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

**8.9 සංඛ්‍යා සටහන**
**කොටස් වෙළඳපොළෙහි තෝරාගත් දර්ශක**

| අයිතම | 2018 අවසානයට | 2019 සැප්. අවසානයට | 2019 අවසානයට | 2020 සැප්. අවසානයට |
|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 6,052.4 | 5,738.2 | 6,129.2 | 5,984.8 |
| වාර්ෂික වෙනස (%) | - 5.0 | - 5.2 | 1.3 | - 2.4 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) | 3,135.2 | 2,759.2 | 2,937.0 | 2,463.3 |
| වසර ආරම්භයේ සිට වෙනස (%) | - 14.6 | -12.0 | - 6.3 | - 16.1 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,839.5 | 2,709.2 | 2,851.3 | 2,595.8 |
| ද.ජා.නි.යේ ප්‍රතිශතයක් ලෙස (%)* | 19.7 | 18.7 | 19.0 | 17.3 |
| වෙළඳපොළ මිල ඉපැයීම් අනුපාතිකය | 9.7 | 10.2 | 10.8 | 10.1 |
| සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන) | 833.6 | 661.0 | 711.2 | 1,481.6 |
| ද්විතීයික වෙළඳපොළ තුළ ශුද්ධ සමුච්චිත විදේශීය මිළදී ගැනුම් (රු. බිලියන) | - 23,247.5 | - 2,570.4 | - 11,735.3 | - 39,856.6 |
| ලැයිස්තුගත කළ සමාගම් ගණන | 297 | 290 | 289 | 285 |
| මූලික මහජන නිකුතුන් | 2 | 0 | 0 | 1 |
| මූලික මහජන නිකුතුන්ගෙන් රැස්කරගත් අරමුදල් ප්‍රමාණය (රු. බිලියන) | 2.0 | 0 | 0 | 8.1 |

* 2019 වසරේ ද.ජා.නි මත පදනම්ව (රු. බිලියන 15,016)

මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

අවසානය වන විට රුපියල් බිලියන 2,595.8ක් දක්වා අඩු විය. 2019 වසර අවසානය වන විට වාර 10.8ක් වූ වෙළඳපොළ මිල ඉපැයීම් අනුපාතය 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට වාර 10.1ක් දක්වා පහත වැටුණි. මේ අතර, සාමාන්‍ය දෛනික පිරිවැටුම පසුගිය වසරේ මුල් මාස නවය තුළ දී පැවති රුපියල් මිලියන 661.0 සමඟ සසඳන කළ 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල් මිලියන 1,481.6ක් දක්වා ඉහළ යන ලදී. 2020 වසරේ මැයි මස මැද භාගයේ සිට අනෙකුත් දර්ශකවල වර්ධනයක් පෙන්නුම් කෙරුවද, විදේශ ආයෝජකයින් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙන් සිය ආයෝජන අඛණ්ඩව ඉවතට ගෙන යන ලදී. ද්විතීයික වෙළඳපොළ තුළ සමුච්චිත විදේශ විකුණුම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා කළ රුපියල් බිලියන 2.6 සමඟ සසඳන කළ 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 39.9ක් විය. 2020 සැප්තැම්බර් මස අවසානය වන විට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි එක් මූලික මහජන නිකුතුවක් පමණක් පැවති අතර එමගින් රුපියල් බිලියන 8.1ක් රැස් කරගන්නා ලදී.

## මූල්‍ය යටිතල පහසුකම්

### ගෙවීම් සහ පියවීම් පද්ධතිවල වර්ධනය

- **පුද්ගලික හා ආයතනික වශයෙන් වන ගෙවීම් හා පියවීම් අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම මගින් රටෙහි ආර්ථික කටයුතු සඳහා ජාතික ගෙවීම් යටිතල පහසුකම් අඛණ්ඩව ආයක විය.** කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ ද, හදිසි ගෙවීම් සහ වෙනත් ගනුදෙනු සිදුකළ හැකි වන පරිදි ගෙවීම් හා පියවීම් පද්ධතිවල අඛණ්ඩ මෙහෙයුම් සහතික කරන ලදී.

- **ලංකාසෙට්ල් පද්ධතිය, තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙක්‍යු පද්ධතිය නමින් වන එකිනෙක සබැඳුනු පද්ධති දෙකකින් සමන්විත වේ.** තත්කාලීන දළ පියවීම් පද්ධතිය විසින් බැංකු අතර වන ගනුදෙනු මෙන්ම අනෙකුත් ගනුදෙනුකරුවන් සමඟ කෙරෙන විශාල වටිනාකම් සහිත කාල සංවේදී ගනුදෙනු පියවීම සිදු කරනු ලබයි. විශාල වටිනාකම් සහිත ගනුදෙනු සඳහා තත්කාලීන දළ පියවීම් පද්ධතිය භාවිතා කිරීම දිරිගැන්වීමට ගනුදෙනුවක් සඳහා අය කෙරෙන උපරිම ගාස්තුව 2020 වසරේ ඔක්තෝම්බර් 01 දින සිට රුපියල් 1,000 සිට රුපියල් 400ක් දක්වා අඩු කරන ලදී. තවද, ගනුදෙනුකරුවන්ට තත්කාලීන දළ පියවීම් පද්ධතිය භාවිතා කිරීමට වැඩි කාලයක් ලබා දෙමින් ගනුදෙනු භාරගන්නා උපරිම කාලය ප.ව. 12.30 දක්වා දීර්ඝ කරන ලදී.

- **ජාතික කාඩ්පත් ක්‍රමවේදය යටතේ නිකුත් කරන ලද ගෙවීම් කාඩ්පත් වල, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදු කරනු ලබන අතර මෙම කාඩ්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා සංශෝධිත ගාස්තු ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී.** ඒ අනුව, ජාතික කාඩ්පත් ක්‍රමවේදය යටතේ නිකුත් කරන ගෙවීම් කාඩ්පත් භාවිතා කරමින් සිදු කරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු සඳහා අය කළ හැකි උපරිම ගාස්තු ඇතුළත් කිරීමට 2014 අංක 1 දරණ පොදු විධිවිධානය ප්‍රතිස්ථාපනය කරමින්, ස්වයංක්‍රීය

8

ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කෙරෙන ගනුදෙනු සඳහා අයකළ හැකි ගාස්තු ඇතුළත් 2020 අංක 1 දරණ පොදු විධිවිධානය නිකුත් කරන ලදී.

- **ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, අන්තර්ජාලය පදනම් කරගත් බැංකු කටයුතු, ජංගම දුරකථන පදනම් කර ගත් බැංකු කටයුතු, ස්වයං සේවා ගෙවීම් යන්ත්‍ර සහ බැංකු කවුළු යන බහුවිධ ගෙවීම් මාධ්‍ය හරහා සිදු කෙරෙන ගෙවීම් නිෂ්කාශනය සඳහා යටිතල පහසුකම් සපයන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය භාවිතා කරමින් ගනුදෙනු මෙහෙයවීම හා නිෂ්කාශනය සඳහා ගෙවීම් ක්‍රමවේද කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** අඩු වටිනාකම් සහිත ගනුදෙනු සඳහා ජංගම යෙදුම් පදනම් කරගත් ගෙවීම් විසඳුමක් වන ජස්ට්පේ (JustPay), රු. 10,000 දක්වා වටිනාකමින් යුතු ගෙවීම් සඳහා පහසුකම් සලසන ලදී. 2020 වසරේ අප්‍රේල් මාසයේ දී, ජස්ට්පේ මගින් සිදුකෙරෙන ගනුදෙනුවක උපරිම අගය රු. 25,000 දක්වා වැඩි කරන ලදී. ඊට අමතරව, මංගත තත්කාලීන ගෙවීම් සඳහා පහසුකම් සලසන ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හා සම්බන්ධ වීමට රාජ්‍ය හා පෞද්ගලික ආයතන කිහිපයකටම අනුමැතිය ලබා දුන් අතර 2020 වසරේ සැප්තැම්බර් මස අග වන විට ආයතන තුනක් එනම්, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා තත්කාලීන ගෙවීම් සඳහා පහසුකම් සලසන ලදී.

- **අඩු පිරිවැයක් සහිතව ගෙවීම් කටයුතු කිරීම සඳහා විකල්පයක් සැපයීම සහ විවිධ ගෙවීම් යාන්ත්‍රණ සහ උපකරණ වල අන්තර් ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා "LANKAQR" ලෙස සන්නාම ලද ජාතික QR කේත පිරිවිතර නිකුත් කරන ලදී.** මීට අමතරව, QR කේත පදනම් කරගත් ගෙවීම් විකල්පය මගින් ගනුදෙනුකරුවාහට පහසුව ද සපයනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව, QR කේත සඳහා සහතික ලත් ආයතනවල සහභාගීත්වයෙන් 2020 වසරේ දී LANKAQR නිල වශයෙන් දියත් කරන ලදී. මෙම ගෙවීම් ක්‍රමවේදය සඳහා වෙළඳුන් බඳවා ගැනීම සහ ඒ සඳහා ගනුදෙනුකරුවන්ගේ දැනුවත්මභාවය සහ භාවිතය වැඩි කිරීම සඳහා දිවයින පුරා LANKAQR ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **මහ ජනතාව විසින් ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණ භාවිතා කිරීමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමෙන් 2020 වසර ඩිජිටල් ගනුදෙනු වසර ලෙස නම් කරන ලදී.** ඒ අනුව, දැනුම්වත්භාවය වැඩි කිරීම සහ එදිනෙදා ගනුදෙනු සිදු කිරීම සඳහා ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණ භාවිතා කිරීමට මහ ජනතාව දිරිමත් කිරීම සඳහා නොයෙකුත් ප්‍රවර්ධන වැඩසටහන් 2020 වසර පුරා සිදු කරන ලදී. 2020 වසරේ මාර්තු මස, ගනුදෙනුකරුවන් සහ වෙළඳුන් මුදල් මගින් ගනුදෙනු කිරීමේ දී ඇති වන දුෂ්කරතාවයන් ඉස්මතු කරමින් "Cash වදේ" සංකල්පය සහිතව ඩිජිටල් වැඩසටහන් දියත් කරන ලදී. ඊට අමතරව, ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණ පිළිබඳව සිය කාර්ය මණ්ඩල සහ ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම සඳහා ඩිජිටල් ගනුදෙනු වසර වැඩසටහන යටතේ සියලුම පාර්ශ්වකරුවන් වෙත පෝස්ටර් සහ බැනර් ආදිය බෙදා හරින ලදී.

- **කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරන සහ මූල්‍ය නිෂ්පාදන හා සේවාවන් සඳහා ප්‍රවේශය වැඩි කරන, මූල්‍ය තාක්ෂණ නවෝත්පාදන සක්‍රීය කිරීමේ සහ දිරි ගැන්වීමේ අරමුණින් 2020 වසරේ පෙබරවාරි මස දී මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශය ආරම්භ කරන ලදී.** ඒ අනුව, පරීක්ෂණ අවකාශය විසින් නියාමන අවශ්‍යතා උල්ලංඝනය කිරීමකින් තොරව නව නිපැයුම්කරුවන්ට සිය නිෂ්පාදන හා සේවාවන් පරීක්ෂා කිරීමට අවශ්‍ය ආරක්ෂිත අවකාශයක් පාලිත පරිසරයක් තුළ දී ලබාදෙනු ඇත.

- **ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශණ හා නිරීක්ෂණ කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය, 2020 - 2022 සඳහා වන සිය ඉදිරි දැක්ම පිළියෙළ කරන ලදී.** මෙම ඉදිරි දැක්ම, අන්තර් බැංකු ගෙවීම් යටිතල පහසුකම් පුළුල් කිරීම, විද්‍යුත් ගෙවීම් ප්‍රවර්ධනය, ප්‍රමිතිකරණය සහ අන්තර් ක්‍රියාකාරීත්වය, ගෙවීම් පද්ධති සඳහා වන නවෝත්පාදන, ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව වඩා ශක්තිමත් කිරීම සහ මහ ජනතාව දැනුම්වත් කිරීම යන ක්ෂේත්‍රයන් පුළුල්ව ආවරණය කරනු ලැබේ. තවද, ඩිජිටල් ගෙවීම් වේදිකාව, විවෘත යෙදුම් ක්‍රමලේඛ අතුරු මුහුණත සහ අතත්‍ය බැංකුකරණය වැනි නවෝත්පාදන සහ සංකල්ප කෙරෙහි අවධානය යොමු කිරීමට ජාතික ගෙවීම් කවුන්සිලය විසින් මූල්‍ය තාක්ෂණ සංවර්ධනයන් සඳහා වන කමිටුවක් පත් කරන ලදී.

- **බ්ලොක්චේන් තාක්ෂණය සඳහා වන ක්‍රියාකාරී කමිටුව** **මූල්‍ය සේවාවන්හි ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා බ්ලොක්චේන් තාක්ෂණය භාවිතා කිරීමේ හැකියාව අධ්‍යයනය කළ අතර බ්ලොක්චේන් තාක්ෂණය මත පදනම් වූ ඔබගේ ගනුදෙනුකරු හඳුනා ගැනීම සඳහා වූ හවුල් ක්‍රමවේදයක් සඳහා පහසුකම් සැලසීමට පළමුව නිර්දේශ කරන ලදී.** ඒ අනුව, ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වූ හවුල් ක්‍රමවේදයක් සඳහා බ්ලොක්චේන් තාක්ෂණය භාවිතා කිරීමේ හැකියාව තක්සේරු කිරීමට සංකල්ප සාධනයක් නිර්මාණය කිරීමට ආරම්භක පියවර ගන්නා ලදී. ඩිජිටල් ගනුදෙනු වල කාර්යක්ෂමතාවය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමටත් එමගින් භෞතික මුදල් භාවිතය අවම කිරීම සහ වැඩි මූල්‍ය අන්තර්ගතභාවයක් ඇති කිරීම සඳහා මූල්‍ය තාක්ෂණ කමිටුව විසින් සලකා බලන ලද යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මීට අමතරව, නව ගෙවීම් නිෂ්පාදන සහ සංකල්ප හඳුන්වාදීමෙන් මූල්‍ය අංශයේ සංවර්ධනයට පහසුකම් සැලසීමට සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ශක්තිමත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

### විදේශ විනිමය නියාමනය සහ සුපරීක්ෂණය

- **විවිධ පාර්ශ්වකරුවන්ගේ ගැටළු හා කරුණු සලකා බැලීමට සහ විදේශ විනිමය ගනුදෙනු තවදුරටත් පහසු කිරීම සඳහා සමාලෝචනය කරන කාලපරිච්ඡේදය තුළ දී 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ වන රෙගුලාසි සහ විධාන නැවත අධීක්ෂණය කරන ලදී.** එකී යෝජිත සංශෝධන මුදල් අමාත්‍යතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. තවද, විදේශ විනිමය පනතේ ඇති යම් යම් ගැටළු විසඳීමේ අරමුණින් සහ විදේශ විනිමය ගනුදෙනුවල නීතිමයභාවය ශක්තිමත් කිරීමේ අරමුණින් විදේශ විනිමය පනත සඳහා යෝජිත සංශෝධන මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

- **විනිමය අනුපාතය මත ඇති පීඩනය ලිහිල් කිරීමට සහ විදේශ සංචිත තත්ත්වය වැඩිදියුණු කිරීමට වසර තුළ දී පියවර කිහිපයක් ගන්නා ලදී.** ඒ අනුව, කලින් අවසර ලබා දී තිබූ එ.ජ. ඩොලර් 10,000ක සංචාරක දීමනාව වෙනුවට ඕනෑම අරමුණක් සඳහා විදේශ සංචාරයක යෙදෙන ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයෙකු හට සංචාරක දීමනාව වශයෙන් එ.ජ. ඩොලර් 5,000ක (හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන ප්‍රමාණයක) උපරිමයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීමට උපදෙස් ලබා දෙමින් බලයලත් වෙළඳුන් වෙත නියෝග නිකුත් කරන ලදී. තවද, හඳුනාගත් ඇතැම් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ, ගෙවීම මත ලේඛන (Documents Against Payments) සහ විවෘත ගිණුම් (Open Account Payments) ක්‍රම යටතේ ආනයනය කිරීම සඳහා වන ගෙවීම්වලට විදේශ විනිමය නිකුත් කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි 2020 වසරේ ජූනි 20 දක්වා මාස තුනක කාලයක් සඳහා අත්හිටුවන ලදී. විදේශ විනිමය උපයන්නන් මුහුණ දෙනු ලබන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs) හිමියන්ට සහ තම රැකියාව අහිමි වූ හෝ එම හේතුව නිසාම නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට සිදු වූ විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන්හට, විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය විදේශ ව්‍යවහාර මුදලින් ආපසු අයකර ගැනීමට නොහැකි අවස්ථාවලදී අවසාන පිළියම වශයෙන්, අවශ්‍ය වන පරිදි එකී ණය ශ්‍රී ලංකා රුපියල් ණය බවට පරිවර්තනය කර ශ්‍රී ලංකා රුපියල්වලින් අයකර ගැනීමට දැනුම් දෙමින් බලයලත් වෙළඳුන් හට විධානයන් නිකුත් කරන ලදී. විනිමය පාලන පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයකට අනුව, යම් බැහැරකිරීම්වලට යටත්ව ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම (OIA) හරහා සිදු කරනු ලබන විදේශ ආයෝජන අත්හිටුවීම, ජංගම ගනුදෙනු මත වන ප්‍රේෂණ හැර ශ්‍රී ලංකාව තුළ නේවාසික හෝ ශ්‍රී ලංකාව තුළ සිටින පුද්ගලයන් විසින් පවත්වගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCA) හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCA) හරහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවීම, දැනටමත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පා ඇති විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRAs) හරහා සිදු කරනු ලබන සංක්‍රමණික දීමනා යටතේ වන අරමුදල් ප්‍රේෂණ අත්හිටුවීම සහ සංක්‍රමණික දීමනාවට පළමු වරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව එ.ජ. ඩොලර් 30,000ක උපරිමයකට සීමා කිරීම ඇතුළත්ව, ප්‍රාග්ධන ගනුදෙනු මත වන ප්‍රතිමුඛ ප්‍රේෂණ මාස 3ක කාලයක් සඳහා අත්හිටුවීමට කටයුතු කරන ලදී.

- **මෙම නියෝගය අහෝසි වූ විට, විදේශ විනිමය පනතෙහි 22 වන වගන්තිය යටතේ, තවත් මාස හයක කාලයක් සඳහා ප්‍රාග්ධන ගනුදෙනු වෙනුවෙන් වූ ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා පියවර ගනිමින්,**

8

**නව නියෝගයක් නිකුත් කරන ලදී.** මෙම ක්‍රියාමාර්ග අතරට නියෝගයේ වලංගු කාලය තුළ ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම (OIA) හරහා යම් බැහැර කිරීම්වලට යටත්ව, විදේශ ආයෝජන සඳහා ප්‍රතිමුඛ ප්‍රේෂණ යැවීමට ලබා දී ඇති පොදු අවසරය අත්හිටුවීම, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs) හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs) හරහා සිදු කරනු ලබන ජංගම ගනුදෙනු හෝ එ.ජ. ඩොලර් 20,000ක උපරිමයක් දක්වා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ හැර අනෙකුත් ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවීමත් සිදු කරන ලදී. තවද, නියෝගයේ වලංගු කාලය තුළ, සංක්‍රමණික දීමනාවක් ඉල්ලා සිටි හෝ පළමුවරට සංක්‍රමණික දීමනාව ඉල්ලා සිටින සංක්‍රමණිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම (CTRA) හරහා සංක්‍රමණික දීමනාව යැවීම උපරිම වශයෙන් පිළිවෙලින්, එ.ජ. ඩොලර් 20,000ක් සහ එ.ජ. ඩොලර් 30,000ක් දක්වා සීමා කරන ලදී.

- **ආමුඛ ප්‍රේෂණ තවදුරටත් දිරිගැන්වීම සඳහා, විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියෝග මගින් "විශේෂ තැන්පතු ගිණුම" (SDA) නමින් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හඳුන්වා දුන් අතර, එම ගිණුම ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයෙකුට සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ඕනෑම පුද්ගලයෙකුට, 2020 වසරේ ඔක්තෝම්බර් 02 වන දින තෙක් නව ආමුඛ ප්‍රේෂණ මගින් ආරම්භ කිරීමට ඉඩ සලස්වන ලදී.** ඒ අනුව විශේෂ තැන්පතු ගිණුම විවෘත කර පවත්වා ගෙන යෑමේ නිර්ණායක සහ ඒ සඳහා අවසරලත් ගනුදෙනු සඳහන් කරමින් බලයලත් වෙළඳුන් වෙත උපදෙස් නිකුත් කරන ලදී. බැංකු පද්ධතිය හරහා ලැබෙන ආමුඛ ප්‍රේෂණවලට අමතරව නීත්‍යානුකූලව අත්පත් කරගත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විශේෂ තැන්පතු ගිණුම වෙත භාර ගැනීමට මෙම විධාන මගින් බලයලත් වෙළඳුන් වෙත හැකියාව ලැබේ. විදේශීය ව්‍යවහාර මුදල් ස්වරූපයෙන් වැඩි තැන්පතු ප්‍රමාණයක් විශේෂ තැන්පතු ගිණුම වෙත ආකර්ෂණය කර ගැනීමේ අදහසින්, විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ පැවති නියෝගය අවලංගු කරමින්, පුද්ගලයෙකුට සන්තකයේ තබා ගත හැකි විදේශ මුදල් ප්‍රමාණය පෙර අවසර දී තිබූ එ.ජ. ඩොලර් 10,000ක සිට එ.ජ. ඩොලර් 15,000ක් දක්වා ඉහළ නැංවීමට නව නියෝගයක් නිකුත් කරන ලදී.

- **රටෙහි විදේශ මුදල් සංචිත තත්ත්වයට පවතින ධනාත්මක බලපෑම සැලකිල්ලට ගනිමින්, පවත්නා සාමාන්‍ය කාලීන තැන්පතු පොලී අනුපාත සහිතව විශේෂ තැන්පතු ගිණුම් කල්පිරීමෙන් පසු අලුත් කිරීමට සහ තවදුරටත් පවත්වාගෙන යෑමට බලයලත් වෙළඳුන්හට අවසර ලබා දෙමින්, විදේශ විනිමය පනත යටතේ නියෝග හා විධාන නිකුත් කරන ලදී.** මෙම රෙගුලාසි මගින් විශේෂ ගිණුම් තැන්පතු හිමියන්, ආමුඛ ආයෝජන ගිණුමක් (IIA) හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (PFCA) ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යෑමට සුදුසුකම් ලබන්නේ නම්, විශේෂ තැන්පතු ගිණුම් කල්පිරීමේ දී ලද මුදල් එම ගිණුම් වෙත මාරු කිරීමට ඉඩ සලසා දී ඇත.

## මූල්‍ය පාරිභෝගික සබඳතා

- **1949 අංක 58 දරන මුදල් නීති පනතේ සංශෝධිත 33 වන වගන්තිය යටතේ මූල්‍ය පාරිභෝගිකයන්ට අදාළ ගැටළු විසඳීම විධිමත් කිරීමේ අරමුණින් මහ බැංකුව විසින් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.** ඒ අනුව, අදාළ කොන්දේසි සහිත යෝජිත මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව මගින් ඉදිරියේදී, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රතිපත්ති කිහිපයක් ඉදිරිපත් කර ඇත. කෙටිකාලීනව, මහ බැංකුව වෙත යොමු කරන සියලුම බාහිර පැමිණිලි සහ දුක් ගැනවිලි ලබා ගැනීමට හා අදාල අංශ වෙත යොමු කිරීම සඳහා මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව තනි සම්බන්ධීකරණ ආයතනයක් ලෙස ක්‍රියා කරනු ඇත. මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වන මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතන වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ප්‍රාථමික වෙළෙඳුන්, ගෙවීම් සහ පියවීම් පද්ධතියේ සහභාගිකරුවන් වේ. මේ අතර, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව මගින් මධ්‍ය කාලීන වැඩ පිළිවෙළක් ලෙස, වෙළඳපොළ හැසිරීමේ ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ සංවර්ධනයන් හා යහපත් පරිචයන්ට අනුකූලව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, අක්‍රමිකතා සහ විෂමාචාරයන් සම්බන්ධයෙන් පූර්ව හා ක්‍රියාකාරී ක්‍රියාමාර්ග ගැනීම සහ නැගී එන ගැටලු හා අවදානම් හඳුනා ගැනීම සහ අධීක්ෂණය කිරීම වැනි පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධ කරුණු

කෙරෙහි අවධානය යොමු කිරීමට අපේක්ෂා කෙරේ. එසේම, මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ නව පනතක් බලාත්මක වන තෙක් පවත්නා නීතිමය රාමුව යටතේ සංක්‍රාන්ති නීතිමය වැඩපිළිවෙලක් හඳුන්වා දීමට ද මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව සැලසුම් කරයි.

- **මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතනවලට අදාළ පැමිණිලි, දුක් ගැනවිලි සහ විමසීම් සැලකිය යුතු ප්‍රමාණයක් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව වෙත අඛණ්ඩව ලැබෙමින් පවතී.** මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කළ 2020 අගෝස්තු 10 වන දින සිට 2020 සැප්තැම්බර් 30 වන දින දක්වා ලැබුණු මුළු ඇමතුම්, ෆැක්ස් පණිවුඩ, විද්‍යුත් තැපැල් පණිවුඩ සහ ලිපි සංඛ්‍යාව 10,000ක් පමණ වේ. තවද, මහ බැංකුව තුළ නවීන පාරිභෝගික සම්බන්ධතා මධ්‍යස්ථානයක් පිහිටුවීමට මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇති අතර, එය 2020 වසර අවසානයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

- **මෙම දෙපාර්තමේන්තුව දිගුකාලීනව, ශ්‍රී ලංකාවේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව විධිමත් කරමින්, දැනට වෙන් වෙන් වශයෙන් පවතින මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවලට අදාළ ගැටළු විසඳමින්, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ පවතින සියලුම නියාමනය කරනු ලබන ආයතන ඇතුළත් වන පරිදි නව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ අධිකාරියක් බවට පත් කිරීමට බලාපොරොත්තු වේ.** මෙම නව අධිකාරිය නව අණ පනතක් මගින් පිහිටුවනු ලබන අතර එහි අනෙකුත් කරුණු අතර සහභාගිත්ව මූල්‍ය ආයතනයන්හි විෂාමාචාරයන්ට අදාළව මූල්‍යමය දණ්ඩනයන් පැනවීම වැනි කරුණු ද ඇතුළත් වනු ඇත.

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

- **2017 වසරේ ඔක්තෝබර් මාසයේ දී මූල්‍ය කාර්යසාධක බලකාය (Financial Action Task Force - FATF) විසින් ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ උපායමාර්ගික දුර්වලතා සහිත රටක් ලෙස 'අළු ලේඛනගත' කිරීමත් සමග 2018 වසරේ පෙබරවාරි මාසයේ දී යුරෝපා කොමිසම විසින් ඉහළ අවදානම් සහිත තුන්වන පාර්ශ්වයේ රටක් ලෙස ශ්‍රී ලංකාව ලැයිස්තුගත කරන ලදී.** මූල්‍ය කාර්යසාධක බලකාය විසින් ශ්‍රී ලංකාව 'අළු ලේඛනගත' කිරීමත් සමඟ හඳුනාගත් උපායමාර්ගික දුර්වලතා මඟහරවා ගැනීම සඳහා කාලරාමුවකට යටත් වූ ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී. ඒ අනුව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ ඉහත ක්‍රියාකාරී සැලැස්ම, ලබා දුන් නිශ්චිත කාලරාමුව තුළ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගත් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසරේ ඔක්තෝබර් 13 සිට 18 දක්වා පැරිසියේ පැවති මූල්‍ය කාර්යසාධක බලකායේ සැසිවාරයේ දී 'අළු ලේඛනයෙන්' ශ්‍රී ලංකාව ඉවත් කිරීමට කටයුතු කරන ලදී. මූල්‍ය කාර්යසාධක බලකාය විසින් ඉහත කී ලේඛනයෙන් ශ්‍රී ලංකාව ඉවත් කිරීමෙන් පසුව, යුරෝපා කොමිසම විසින් 2020 වසරේ මැයි මස 7 වන දින ප්‍රකාශයට පත් කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ උපායමාර්ගික දුර්වලතා සම්බන්ධයෙන් ඉහළ අවදානම් සහිත තුන්වන පාර්ශ්වයේ රටවල් ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කරන ලදී.

- **මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතාවය ශක්තිමත් කිරීම සඳහා, 2020 වසරේ මුල් මාස නවය තුළ මූල්‍ය බුද්ධි ඒකකය විසින් චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ කිහිපයක් නිකුත් කරන ලද අතර, ගණකාධිකාරීවරුන් සහ භාරයන් හෝ සමාගම් සේවා සපයන්නන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා බැඳීම් සහ, බලපත්‍රලාභී මුදල් සමාගම්, රක්ෂණ සමාගම් සහ කොටස් තැරැව්කරුවන් සඳහා LankaFIN වාර්තාකරණ සම්බන්ධයෙන් එමගින් අවධාරණය කෙරිණි.** තවද, ගෝලීය කොවිඩ්-19 වසංගත තත්ත්වය සමඟ ඇති වූ මූල්‍ය පද්ධති අවදානම් සහ අනාරක්ෂිතතාවයන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමේ අරමුණින්, මූල්‍ය ආයතන සුපරීක්ෂාකාරී බවින්, නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම ඉහළ නැංවීමට සහ ගෝලීය කොවිඩ්-19 වසංගතය තුළ ඇති විය හැකි මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම්වලින් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා සුදුසු පියවර ගැනීමට උපදෙස් ලබා දෙමින් මූල්‍ය බුද්ධි ඒකකය විසින් රටේ සියලුම මූල්‍ය ආයතන වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

8

- **නීති විරෝධී මත්ද්‍රව්‍ය වෙළඳාමට සම්බන්ධ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිණිස නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල ප්‍රයත්නයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින්, මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් සිදු කරන විමර්ශන පිළිබඳ විමර්ශන නිලධාරීන් අතර දැනුවත්භාවය වැඩි කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම, විමර්ශකයින්, නඩු පවරන්නන් සහ මූල්‍ය ආයතන සමග අඛණ්ඩව සම්බන්ධීකරණය පවත්වා ගැනීම, ආයතනික අනුකූලතාවය සහතික කිරීම සම්බන්ධයෙන් වන වගකීම් පිළිබඳව මූල්‍ය ආයතන දැනුවත් කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල ප්‍රයත්නයන්ට සහාය වීම වැනි ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කරන ලදී.**

### මූල්‍ය අංශයට අදාල නීති ප්‍රතිසංස්කරණ

- **2020 වසර තුළ දී නීති ප්‍රතිසංස්කරණ කිහිපයක් හඳුන්වා දෙන ලදී.** ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය අධීක්ෂණය සඳහා ශක්තිමත් නෛතික පදනමක් නිර්මාණය කිරීම අරමුණු කොටගෙන දැනට බලාත්මක 1988 අංක 30 දරන බැංකු පනත අහෝසි කර නව බැංකු පනතක් හඳුන්වාදීම සඳහා අවශ්‍ය සුවිශේෂී පියවර ගන්නා ලදී. එසේම, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ ඇති හඳුනාගත් අඩුපාඩු ඉවත් කර එයට අවශ්‍ය සංශෝධන සිදු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ද ආරම්භ කර ඇත. ඊට අමතරව, 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනතට සහ 1937 අංක 07 දරන ලියාපදිංචි තොග සහ සුරැකුම්පත් ආඥා පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීම සඳහා අවශ්‍ය සාකච්ඡා සහ මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී. තවද, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ඒ සඳහා අවශ්‍ය නෛතික රාමුවක් ස්ථාපිත කිරීම සඳහා සාකච්ඡා ආරම්භ කර ඇත.

### නිරාකරණ සහ බලගැන්වීම් ක්‍රියාමාර්ග

- **නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර අවලංගු කළ/අත්හිට වූ තවත් මුදල් සමාගම් තුනක (ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී, ETI ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්) තැන්පතුකරුවන් වෙත ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ වන්දි මුදල් ගෙවීම ආරම්භ කරන ලදී.** තවද, ඊට පෙර බලපත්‍ර අවලංගු කරන ලද සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ෆිනෑන්ස් පී.එල්.සී, ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් සහ ටී.කේ.එස්. ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී යන මුදල් සමාගම් තුනෙහි තැන්පතුකරුවන් සඳහා වන රක්ෂණ වන්දි මුදල් ගෙවීම ද තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිණි. රක්ෂණ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය තවදුරටත් කාර්යක්ෂමව සිදු කරනු වස් ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී., ETI ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ් යන ආයතන තුනෙහි තැන්පත්කරුවන් වෙත වන්දි මුදල් ගෙවීම සඳහා නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර විශිෂ්ඨ භාවිතාවන් අනුගමනය කරමින් 'නියෝජිත බැංකු සංකල්පය' (Agent Bank Concept) හඳුන්වා දෙන ලදී. ඒ අනුව, එකී ආයතන තුනෙහි අගතියට පත් තැන්පතුකරුවන්ට රක්ෂණ වන්දි ගෙවීම සඳහා මුදල් මණ්ඩලය විසින් මහජන බැංකුව නියෝජිත බැංකුව වශයෙන් පත් කරන ලදී.

- **නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් ශිෂ්‍ය ප්‍රජාව සහ රජය නිලධාරීන් ද ඇතුළුව පොදු ජනතාව ඉලක්ක කරමින් දිවයින පුරා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන්නට යෙදුණු අතර ඒවායේ දී අනවසර මුදල් ව්‍යාපාර සහ පිරමීඩාකාර තහනම් යෝජනා ක්‍රම මගින් සිදු වන අලාභ සහ හානි පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලදී.** එසේම, මූල්‍ය ජාවාරම් සහ වංචා සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීම සඳහා විකාශය කරන ලද විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට ද නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ නිලධාරීහු සහභාගි වූහ. ඒ අතරම, නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා පොලීසියේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව තහනම් යෝජනා ක්‍රම පිළිබඳ විමර්ශන සිදු කරන ලදී. මහජනතාව සහ නොයෙකුත් වෙනත් පාර්ශ්වයන්ගෙන් ලැබෙන පැමිණිලි පදනම් කරගෙන නව විමර්ශනයන් ද ආරම්භ කරන ලදී.

### සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය

- මහ බැංකුව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන විවිධ ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමවලට අමතරව කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය දැක්වීමේ අරමුණින් රජය වෙනුවෙන් මහ බැංකුව කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයක් 2020 වසරේ දී

8

**ක්‍රියාත්මක කරන ලදී.** මහ බැංකුව, රජයේ උපදෙස් අනුව කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ තනි පුද්ගල ව්‍යාපාර හා ස්වයං රැකියාලාභීන් ඇතුළුව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන ණය සැපයීමට 'සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම' අදියර තුනකින් ක්‍රියාත්මක කරන ලදී. පළමු අදියර සඳහා මුදල් නීති පනතේ 88 වන වගන්තිය ප්‍රකාරව ප්‍රතිමූල්‍යකරණ පහසුකම ලබාදුන් අතර, දෙවන අදියර මුදල් නීති පනතේ 83 වන වගන්තිය ප්‍රකාරව මූල්‍ය පහසුකම් සැපයීම සඳහා ක්‍රියාත්මක කරන ලදී. මුදල් නීති පනතේ 108 වන වගන්තිය ප්‍රකාරව ණය ඇපකර සහ පොලී සහනාධාර ලබා දීම සඳහා තෙවන අදියර ක්‍රියාත්මක කරන ලදී. 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට මහ බැංකුව විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම යටතේ ප්‍රතිලාභීන් 60,175ක් සඳහා රුපියල් බිලියන 175ක කාරක ප්‍රාග්ධන ණය මුදල් ප්‍රමාණයක් අනුමත කරන ලදී. මහ බැංකුව විසින් අනුමත කරන ලද සමස්ත කාරක ප්‍රාග්ධන ණය ප්‍රමාණයෙන් සියයට 50ක් පමණ සේවා අංශයේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට සහ තනි පුද්ගල ව්‍යාපාරයන්ට ලබා දී ඇති අතර කර්මාන්ත අංශයේ හා කෘෂි කාර්මික අංශයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහ තනි පුද්ගල ව්‍යාපාරයන්ට පිළිවෙළින්, සියයට 34ක හා සියයට 16ක පමණ කාරක ප්‍රාග්ධන ණය ප්‍රමාණයක් ලබා දී ඇත.

- **ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය දැක්වීමේ අරමුණින් තවත් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහයෝගයෙන් තේ ආශ්‍රිත කර්මාන්ත අංශය සඳහා කාරක ප්‍රාග්ධන ණය සැපයීමට සැපයුම් දාම පුනර්ජීවන ණය යෝජනා ක්‍රමය සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, මුදල් අමාත්‍යාංශයේ සහයෝගයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර) යටතේ ලබා දී ඇති ණය සඳහා අය කරනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 7 සිට සියයට 4 දක්වා සහ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික පොලී අනුපාතිකය සියයට 8 සිට සියයට 6 දක්වා අඩු කරන ලදී. තවද, ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීම සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කරමින් ණය අයදුම්කරුවන්ට ලබා ගත හැකි උපරිම ණය මුදල රුපියල් 500,000 සිට රුපියල් මිලියනයක් දක්වා ඉහළ නංවන ලදී. තවද, ස්වශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ නව ව්‍යවසායකයින්ට ලබා ගත හැකි උපරිම ණය මුදල රුපියල් 250,000 සිට රුපියල් 450,000ක් දක්වා ඉහළ නංවන ලදී.

**8.10 සංඛ්‍යා සටහන**

**සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද ණය සහන පහසුකම 2020 සැප්. 30 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ණය පහසුකම් පිළිබඳ විස්තර**

| පහසුකම | අනුමත කරන ලද මුළු ණය ගණන | අනුමත කරන ලද ණයවල වටිනාකම (රු. බිලියන) |
|---|---|---|
| අදියර I (ප්‍රතිමූල්‍ය) | 16,346 | 30 .0 |
| අදියර II | 26,540 | 92.0 |
| අදියර III (ණය ඇප ආවරණ සහ පොලී සහනාධාර) | 17,289 | 53.0 |
| මුළු ගණන | **60,175** | **175.0** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **තවද, විධිමත් මූල්‍ය අංශයෙන් බැහැර වී ඇති පාර්ශ්ව ඉලක්ක කර ගනිමින් මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව 2020 වසර තුළ දී ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත.**

## අපේක්ෂිත වර්ධනයන්

- **කොවිඩ්-19 වසංගතය නිසා බලපෑමට පත් ව්‍යාපාර හා පුද්ගලයන් හට බලපත්‍රලාභී බැංකු විසින් සහන සැපයීමේදී, බැංකු අංශයේ සුරක්ෂිතභාවය හා ශක්තිමත්භාවය සඳහා වැදගත් වන ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම් මැනවින් පවත්වාගෙන යෑම සඳහා මහ බැංකුව විසින් සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග රැසක් හඳුන්වා දෙන ලදී.** කොවිඩ්-19 වසංගතය හේතුවෙන් හානියට පත් ව්‍යාපාර හා පුද්ගලයන් හට සහන සැපයීමට ගත් ක්‍රියාමාර්ග සහ බලපත්‍රලාභී බැංකු සඳහා ක්‍රියාවට නංවන ලද නියාමන ක්‍රියාමාර්ග බැංකු ක්ෂේත්‍රයට කල බලපෑම, තවමත් තක්සේරු කල යුතුව ඇත.

- **හඳුන්වා දුන් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ආර්ථිකය වෙත අරමුදල් ප්‍රවාහයන් වැඩි කිරීම සඳහා මහ බැංකුව විසින් ගන්නා ලද අනෙකුත් සුවිශේෂී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුව යමින්, කෙටි හා මධ්‍ය කාලීනව ණය වර්ධනයේ අනුක්‍රමික ඉහළ යෑමක් අපේක්ෂා කළ හැක.** කෙසේ නමුත්, කොවිඩ්-19 වසංගතය නිසා

පවතින අභියෝගාත්මක මෙහෙයුම් වාතාවරණය හේතුවෙන් බැංකු අංශයේ අක්‍රීය ණයවල ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරන අතර, කොවිඩ්-19 නිසා අක්‍රීය ණය මත ඇති විය හැකි මධ්‍ය හා දිගුකාලීන බලපෑම මෙම අවස්ථාවේ දී නිශ්චිතව පුරෝකථනය කිරීමට නොහැක. ඒ අනුව, මහ බැංකුව විසින් සිදු කරනු ලබන පරීක්ෂාවන් තර කිරීමට කටයුතු කර ඇති අතර, වැඩි වන ණය හා සමගාමීව අක්‍රීය ණය තවදුරටත් ඉහළ යෑම පිළිබඳව බලපත්‍රලාභී බැංකු විසින් සැලකිලිමත් වීම සහ ඒ ආශ්‍රිතව ඇති විය හැකි සියලු අවදානම් කළමණාකරණය සඳහා සුදුසු අවදානම් කළමණාකරණ ක්‍රියාමාර්ග ගත යුතුය.

- **බැංකුවල ප්‍රාග්ධන මට්ටම් ව්‍යවස්ථාපිත අවම අවශ්‍යතාවයන්ට ඉහළින් පවතින අතර, 2020 වසර අවසානය වන විට සැපිරිය යුතුව පැවති ඉහළ දමන ලද අවම ප්‍රාග්ධන මට්ටම් වෙත ළඟා වීමට බැංකු සඳහා 2022 වසර අවසානය දක්වා වසර දෙකක දිගුවක් ලබා දෙන ලදී.** බැංකු හට ආතතිමය කාලයන්වලදී ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි තම ප්‍රාග්ධන මට්ටම් වර්ධනය කර තබා ගන්නා ලෙස 2017 වසරේ සිට නියම කර තිබූ අතර, බාසල් III ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය, බාසල් III තෝලන අනුපාත සහ මූල්‍ය උපකරණ පිළිබඳ නව ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 වැනි ක්‍රියාමාර්ග බැංකුවල ප්‍රාග්ධන මට්ටම් ඉහළ දැමීමට හේතු විය. මෙහි ප්‍රතිපලයක් ලෙස මූල්‍ය හා ආර්ථික ආතතීන් නිසා ඇති විය හැකි කම්පනයන් අවශෝෂණය කර ගැනීමේ හැකියාව වැඩි දියුණු වී ඇති අතර, ඉදිරි වසරවල දී මූල්‍ය ක්ෂේත්‍රයෙන් මූර්ත ආර්ථිකයට අවදානම් පැතිරීමට ඇති හැකියාව ද අවම කෙරේ. මෙකී වර්ධනයන් කුඩා බැංකු හට ඉහල දමන ලද යෝජිත ප්‍රාග්ධන මට්ටම් සපුරා ගැනීම සඳහා සිය ව්‍යාපාරයන් ඒකාබද්ධ කිරීම් වෙත යොමු වීමට වන දිරිගැන්වීමක් ද වනු ඇත.

- **ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතයන් අවශ්‍ය අවම අනුපාතයන්ට අතිරික්තව ස්වාරක්ෂක ලෙස පවත්වා ගැනීම හේතුවෙන් බැංකුවල ද්‍රවශීලතා තත්ත්ව හිතකර මට්ටම්වල පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** කෙසේ නමුත්, බලපත්‍රලාභී බැංකු වෙත කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ සුවිශේෂී අභියෝගයන්ට මුහුණ දීමේ නම්‍යශීලීත්වය ලබා දීම සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතයේ අවම නියාමන අනුපාතය සියයට 100ක සිට සියයට 90ක් දක්වා අඩු කරන ලදී. තවද, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීමේ දී ඇතැම් වත්කම් ද්‍රවශීල ලෙස නිර්ණය කිරීමට ද බලපත්‍රලාභී බැංකු වෙත අවසර ලබා දෙන ලදී. බලපත්‍රලාභී බැංකු විසින් සිය ගනුදෙනුකරුවන් හට සහ පොදුවේ ආර්ථිකයට සහායක් වීමේ අරමුණින් යුතුව මෙම නියාමන ලිහිල් කිරීම් යොදා ගනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, බැංකු අංශය ඉදිරියටත් ස්ථායීව පවත්වාගෙන යෑම සඳහා මින් ලැබෙන ප්‍රතිලාභ ඉවහල් වනු ඇත. මෙයට සමගාමීව, දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති ණය සහන යෝජනා ක්‍රමය සහ අනෙකුත් ක්‍රියාමාර්ග නිසා බැංකුවල ද්‍රවශීලතා අවදානම් පැතිකඩ කෙරෙහි ඇති විය හැකි වෙනස්කම් සැලකිල්ලට ගනිමින් මහ බැංකුව විසින් බැංකුවල ද්‍රවශීලතා මට්ටම් සමීපව නිරීක්ෂණය කරනු ඇත.

- **මූර්ත ආර්ථිකයේ ඇතිවන අවදානම් බැංකු අංශයට පැතිරී යෑමට ඇති ඉඩකඩ වළක්වා ගැනීම සඳහා ඇති විය හැකි අහිතකර තත්ත්වයන් හඳුනා ගැනීමට සාර්ව ආර්ථික වර්ධනයන් නිරීක්ෂණය කරනු ලබයි.** බැංකු අංශයේ ස්ථායීතාවයට ඇතිවිය හැකි යම් අවදානමක් වේ නම් ඒවා කල් තියා මග හරවා ගැනීම සඳහා අවශ්‍ය කරන සාර්ව-විචක්ෂණ ක්‍රියාමාර්ග හඳුන්වා දීමට ද කටයුතු කෙරේ. ඵලදායී බැංකු අධීක්ෂණය සඳහා වන බාසල් හර මූලධර්මයන්ට සහ අනෙකුත් අන්තර්ජාතික විශිෂ්ට පරිචයන්ට අනුගතව, බලපත්‍රලාභී බැංකු වලට අදාළ අධීක්ෂණ හා නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත.

- **නව බැංකු පනත කෙටුම්පත් කිරීම හරහා බලපත්‍රලාභී බැංකු සඳහා වන නෛතික හා නියාමන රාමුව තව දුරටත් ශක්තිමත් වනු ඇත.** යෝජිත නව බැංකු පනත් කෙටුම්පත සඳහා සලකා බැලෙන ප්‍රධාන අංශයන් අතරට නියාමනය හා අධීක්ෂණය සඳහා පුළුල් විධි විධානයක්, ප්‍රාමාණිකත්වය මත පදනම් වූ නියාමන සඳහා ඉඩකඩ සැලසීමට හැකියාව ඇති විභේදිත නියාමන රාමුවක්, ආයතනික යහ පාලනය ශක්තිමත් කිරීම, ඒකාබද්ධ අධීක්ෂණය, නිරාකරණය, මූල්‍යමය දඩ නියම කිරීම, බැංකු වල සංස්පර්ශිත අවදානම අවම කිරීම සඳහා සීමා නිර්ණය කිරීම, ඒකාබද්ධ කිරීම් හා අත්පත්කර ගැනීම් සඳහා ප්‍රතිපාදන ශක්තිමත් කිරීම, අවශ්‍යනම් විශාල විදේශීය බැංකු උපසමාගම්කරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම සහ අවශ්‍ය අවස්ථාවන් හීදී බැංකු සඳහා පරිපාලක සමාගම් ව්‍යුහයන් හඳුන්වා දීම ඇතුළත්ය.

8

- **බැංකු තිරසාරවත්ව ඇගයුම් දර්ශකය (BSRI) නමින් අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමේ ආකෘතියක් මහ බැංකුව විසින් මේ වන විට සමාලෝචනය සහ යාවත්කාලීන කරමින් පවතී.** එමගින්, ඒ ඒ බැංකුවල සහ සමස්ත බැංකු අංශයේ ඵලදායීතාවය, කාර්යක්ෂමතාව සහ තිරසාරත්වය වර්ධනය කරමින් බැංකුවල අවදානම් තත්ත්වයන්හි දී කල් තියා නියාමන මැදිහත්වීම් සිදු කිරීමට සහ අවශ්‍ය පියවර ගැනීමට හැකියාව ලැබෙන අවදානම මත පදනම් කරගත් අධීක්ෂණ රාමුවක් හඳුන්වා දීමට හැකියාව ලැබෙනු ඇත.

- **අවදානම් පැතිර යෑමෙන් බැංකු ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් බැංකු අංශයේ සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා බැංකු සමූහයන්ගේ ඒකාබද්ධ අධීක්ෂණය සිදු කරනු ඇත.** ඒ අනුව, ඒකාබද්ධ අධීක්ෂණය සඳහා නියාමන රාමුවක් සකස් කෙරෙනු ඇති අතර මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන බැංකු පනතට ඇතුලත් කෙරෙනු ඇත.

- **විශාල වාණිජ බැංකු හට කලාපය තුළ ව්‍යාප්ත වීම සඳහා ඇති අවකාශ සොයා බැලීමට දිරිමත් කරන අතර නියාමකයන් සහ දේශාන්තර අධීක්ෂණය අතර තොරතුරු හුවමාරුව ශක්තිමත් කිරීමේ අරමුණින් කලාපයේ අනිකුත් නියාමකයන් සමඟ ඇති සමීප සබඳතා තවදුරටත් පවත්වාගෙන යෑමට කටයුතු කරනු ඇත.**

- **ඉහළ යන සයිබර් ආරක්ෂණ අවදානම් හමුවේ බැංකුවල සයිබර් ආරක්ෂාව තර කිරීම සඳහා අන්තර්ජාතික ප්‍රමිතීන් සහ විශිෂ්ඨ පරිචයන්ට අනුගතව, මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව, පවත්නා නියාමන හා අධීක්ෂණ රාමුවට අවශ්‍ය වෙනස්කම් හඳුන්වා දීමට කටයුතු කරනු ඇත.** යෝජිත නියාමන මගින් බැංකු හට සිය තොරතුරු ආරක්ෂණය හා තාක්ෂණිකව ඔරොත්තු දීමේ හැකියාව ඉහළ දැමීමට සහ ශක්තිමත් කරගැනීමට හැකියාව ලැබෙනු ඇත.

- **බැංකු වල සාම්ප්‍රදායික ව්‍යාපාර ආකෘතීන් මැදි හා දිගු කාලීනව සැලකිය යුතු වෙනස්කම්වලට ලක් වනු ඇති අතර, මේ සඳහා මූල්‍ය තාක්ෂණයේ දියුණුවත් සමඟ ඇති වූ ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතු විකල්ප බැංකු නිෂ්පාදන හා සේවා සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය සමඟ ඇති වූ අභියෝග හේතු වනු ඇත.** පවතින වසංගත තත්ත්වය හමුවේ, මූල්‍ය අන්තර්ගතභාවය සහ ආර්ථික කටයුතු සඳහා සහාය දැක්වීම සඳහා බැංකු විසින් ජංගම බැංකුකරණය සහ අන්තර්ජාල බැංකුකරණය වැනි යෙදවුම් තුළින් බැංකු සේවා සඳහා ඇති ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, බැංකුවල තොරතුරු ආරක්ෂණය කළමණාකරණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ද අවශ්‍ය පූර්ව ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, මෙම නැගී එන ව්‍යාපාර සහ මෙහෙයුම් ආකෘති සඳහා ඉඩකඩ සලසන අතරම බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව හා අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා අනාගතයට ගැලපෙන නියාමන හා අධීක්ෂණ ප්‍රවේශයන් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

- **ඉදිරියේදී, බලපත්‍රලාභී බැංකු සඳහා ප්‍රතිසාදන සැලසුම් ක්‍රියාත්මක කිරීම හරහා අහිතකර තත්ත්වයන්ට මුහුණදීමට බැංකුවල අර්බුද සඳහා සූදානම් වීමේ සහ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කරනු ඇත.** එවැනි අවස්ථාවක දී අර්බුදයට ලක්වූ බැංකු සහ මූල්‍ය අංශය වෙත ඇතිවන බලපෑම අවම කිරීමේ අරමුණින් බැංකු හට සිය ප්‍රතිසාදන සැලසුම් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරනු ඇත. මේ සම්බන්ධයන් බැංකුවල අදහස් දැන ගැනීම සඳහා උපදේශණ පත්‍රිකා දෙකක් නිකුත් කර ඇත. බලපත්‍රලාභී බැංකුවල ප්‍රතිසාදන සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම සඳහා බැංකු පනත් විධානයක් ඉදිරි කාලයේ දී නිකුත් කෙරෙනු ඇත.

- **මහ බැංකුව විසින් 2019 වසරේ අප්‍රේල් 10 වන දින මෙරට තිරසාර මූල්‍යකරණය සඳහා පෙරදැක්මක් දියත් කරන ලදී.** මෙම පෙරදැක්ම මූල්‍ය නියාමකයන්ට සහ මූල්‍ය ආයතනවලට ඔවුන් විසින් මූල්‍ය පහසුකම් සපයන ලද ව්‍යාපෘතීන්ගේ පාරිසරික, සාමාජීය සහ පරිපාලන අවදානම් වඩාත් ඵලදායීව කළමණාකරණය කිරීම මෙන්ම, දේශගුණික හා සාමාජීය වශයෙන් හිතකාමී වූ හරිතමය ව්‍යාපාර සඳහා වැඩි රුකුලක් දැක්වීම සඳහා පුළුල් මගපෙන්වීමක් සිදු කෙරෙනු ඇත. වර්තමානයේ මහ බැංකුව මූල්‍ය ආයතන සඳහා තිරසාර මූල්‍ය වර්ගීකරණය සහ වාර්තාකිරීමේ අවශ්‍යතාවය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක නිරත වෙමින් සිටී.

- **රටෙහි ආර්ථික කටයුතු සඳහා පහසුකම් සැලසීමට බැංකු අංශයේ ස්ථායීතාවය පවත්වාගෙන යනු ඇත.** කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ බැංකුවල පවත්නා ප්‍රාග්ධන හා ද්‍රවශීලතා මට්ටම් ශක්තිමත් කිරීම සඳහා ගන්නා ලද නියාමන ප්‍රයත්නයන් සහ සුවිශේෂී ප්‍රතිපත්ති තීරණ සලකා බැලීමේ දී, අවදානම් කළමණාකරණය සහ ආයතනික යහපාලනය වැඩිදියුණු කිරීම සහ බලපත්‍රලාභී බැංකුවල අධීක්ෂණය හා නියාමනය වැනි කාර්යයන් පුළුල් කිරීම මගින් බැංකු පද්ධතියේ නම්‍යශීලි බව සහ ස්ථාවරත්වය පවත්වාගනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එමගින් ඉදිරියේදී මූර්ත ආර්ථිකයට කාර්යක්ෂමව හා ඵලදායීව සේවා සපයනු ඇත.

- **කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තියත් සමග මහ බැංකුවේ අධීක්ෂණ ප්‍රවේශයන් නව සාමාන්‍ය තත්ත්වයන්ට ගැලපෙන ආකාරයට අනුගත වනු ඇත.** මේ අනුව, මහ බැංකුව විසින් බලධාරීන් විසින් නිකුත් කරනු ලබන සෞඛ්‍ය මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් අවශ්‍ය අවස්ථාවන්හි දී සිය ස්ථානීය අධීක්ෂණ කටයුතු දුරස්ථව සිදු කිරීමට කටයුතු කරනු ඇත. මෙහිදී, අවශ්‍ය වුවහොත් විතැන් අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇති අතර, ඒ හරහා බැංකුවල අවදානම් කළමණාකරණ ක්‍රියාවලියේ අඩු පාඩු නිසා ඇති විය හැකි අවදානම් හඳුනාගැනීම සහ ඒවාට කාලීන පිළියම් යෙදීමටත් මහ බැංකුවට හැකිවනු ඇත. එබැවින්, නියාමන පිළිබඳ තොරතුරු විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ලබා ගැනීමේ අවශ්‍යතාව ඉහළ යනු ඇති අතර, මහ බැංකුවේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කාලීන සහ නිර්වද්‍ය දත්ත ලබාදීමේ වගකීම බලපත්‍රලාභී බැංකු වෙත පැවරෙනු ඇත. තවද, පවත්නා සමාජ දුරස්ථභාවය සම්බන්ධ නීතිරීති සහ ගමනාගමන සීමාවන් සැලකිල්ලට ගනිමින් ඉදිරියේ දී බැංකු කළමණාකාරීත්වය සමග මුහුණට මුහුණලා කෙරෙන රැස්වීම් වෙනුවට විද්‍යුත් මාධ්‍ය ඔස්සේ අතත්‍ය රැස්වීම් පැවැත්වීමට කටයුතු කෙරෙනු ඇත.

- **පවත්නා නියාමන රාමුව වෙනස් කිරීමෙන් මධ්‍ය කාලීනව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ස්ථාවරත්වය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා මුදල් ව්‍යාපාර පනත සඳහා සංශෝධන යෝජනා කර ඇත. තවදුරටත්, වර්තමාන වෙළඳපොළ වර්ධනයට අනුකූලව බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් සඳහා පවත්නා නියාමන රාමුව පරිපූර්ණ දැක්මක් සහිතව සමාලෝචනය කිරීමට සහ විධිමත් කිරීමට කටයුතු කරනු ඇත.

- **ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධනය ඉහළ නැංවීම හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ප්‍රාග්ධන මට්ටම තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** අවම ප්‍රාග්ධන මට්ටම් ඉහළ නැංවීම සහ නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමත් සමග ඉදිරි වසර කිහිපය තුළ මෙම අංශයේ ප්‍රාග්ධන මට්ටම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම අංශයේ ඉහළ නංවන ලද ප්‍රාග්ධන මට්ටම් ආතති කාලපරිච්ඡේදයන් තුළ අවදානම් දරා ගැනීමේ හැකියාව වර්ධනය කරනු ඇත.

- **ඉදිරියේදී, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා විධිමත් නිරාකරණ රාමුවක් ස්ථාපිත කිරීමට සැලසුම් කරනු ලබයි.** මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන වලට අනුව දුර්වල/අධි අවදානම් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම් නිරාකරණය කිරීම සඳහා පියවර ගනිමින් සිටී. බලපත්‍රය අවලංගු කර ඇති/ව්‍යාපාර මෙහෙයුම් අත් හිටුවන ලද මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක ක්‍රමය හරහා සිදු කෙරේ. බලපත්‍රලාභී මුදල් සමාගම් වල දුර්වලතා කාලෝචිත ලෙස හඳුනා ගැනීම, තැන්පතුකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීම සහ බලපත්‍රලාභී මුදල් සමාගම් අසමත් වීමෙන් මහ ජනතාවට හා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක ක්‍රමයට සිදුවන පිරිවැය අඩු කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා මාර්ගෝපදේශයක් නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.

- **ප්‍රශස්ත සහ මනා කාර්යසාධනයක් පෙන්වන මුදල් සමාගම් 25ක් ස්ථාපිත කිරීමේ අරමුණින් සැලස්මක් ස්ථාපිත කර ඇති අතර එය මධ්‍යකාලීනව ක්‍රියාත්මක කරනු ලැබේ.** බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ දුර්වලතා හා අවධානම් සපුරාලීම සඳහා සියලුම ආයතන වසර පහකට පසු අවම විචක්ෂණ අවශ්‍යතාවන්ට වඩා ඉහළින් පවතින, රටෙහි ආර්ථික

8

අවශ්‍යතා වලට ඵලදායී ලෙස දායක විය හැකි විවිධාංගිකරණය වූ ව්‍යාපාරික ආකෘතීන්ගෙන් සමන්විත ශක්තිමත් සහ ස්ථාවර බලපත්‍රලාභී මුදල් සමාගම් බවට සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් මෙම අංශය සඳහා මධ්‍ය කාලීන ඒකාබද්ධ කිරීමේ සැලැස්මක් යෝජනා කර ඇත.

- **බලය ලත් වෙළඳුන්ගෙන් දත්ත රැස් කිරීම සඳහා විස්තීර්ණ සීමා ගනුදෙනු සහ විදේශ විනිමය ගනුදෙනු නිරීක්ෂණය කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීමේ මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.** මෙය ස්ථාපිත කිරීමෙන් පසු මෙම නිරීක්ෂණ පද්ධතිය මගින් සියලුම විදේශ විනිමය විකුණුම් හා ගැණුම් සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළට ගලාඒම් සහ පිටතට ගලායෑම් වලට අදාළ සියලුම දත්ත ලබා ගැනීමට අපේක්ෂා කරන අතර මෙමගින්, ප්‍රතිපත්ති සම්පාදනයට බලපාන දත්තවල අඩුපාඩු සම්පූර්ණ කිරීමට අදහස් කරනු ලබයි.

- **යෝජිත නව බැංකු පනත ඔස්සේ මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ක්‍රමවේදවලට අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයට අදාළ නියාමන පද්ධතිය ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.** 2021 වසරේ පළමු කාර්තුව තුළ දී ද දැනට සිදු කෙරෙමින් පවතින වන්දි මුදල් ගෙවීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත. යෝජනා ක්‍රමයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා දත්ත පදනම් සහ අනෙකුත් පද්ධති මනාව පවත්වා ගැනීමට අදාළ නියාමන දෙපාර්තමේන්තුවල සහයෝගය ඇතිව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වල එතැන් අධීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට ද අපේක්ෂා කෙරේ. පවත්නා නීති රාමුව තුළ බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා නිරාකරණ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමට ද සැලසුම් කර ඇත.

- **තහනම් යෝජනා ක්‍රම සහ එවැනි මූල්‍ය වංචා සම්බන්ධ විමර්ශන වැඩිදියුණු කිරීම සඳහා නිරාකරණ සහ බලගැන්වීමේ දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය ශක්තිමත් කිරීමට පියවර ගැනෙනු ඇත.** මූල්‍ය වංචා පිටු දැකීමේ වැදගත්කම සම්බන්ධයෙන් පාසල් ළමුන්, රාජ්‍ය නිළධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන, වැනි පොදු ජනතාවගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා තහනම් යෝජනා ක්‍රම සම්බන්ධ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සිදු කරනු ලබයි.

- **ලෝක බැංකු සමූහයේ සාමාජිකයෙකු වන ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයේ (IFC) සහාය ඇතිව සකස් කරන ලද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය 2020 වසරේ සිව්වන කාර්තුවේ දී නිල වශයෙන් දියත් කිරීමට අපේක්ෂා කෙරේ.** මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ මූලික අරමුණ වනුයේ රටපුරා මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම සඳහා වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම ක්‍රියාවලියක් හඳුනාගැනීම සහ ප්‍රවර්ධනය කිරීමයි. මහ බැංකුව විසින් රටේ මූල්‍ය සාක්ෂරතාවයේ මට්ටම අවබෝධ කර ගැනීම සඳහා 2020 වසරේ සිව්වන කාර්තුවේ දී ශ්‍රී ලංකාව තුළ ප්‍රථම මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණය පැවැත්වීමට නියමිත අතර, රට තුළ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමේ අරමුණින් උපායමාර්ග සකස් කිරීම සඳහා ඉහත සමීක්ෂණයෙන් අනාවරණය වන මූලික සොයා ගැනීම් උපයෝගී කර ගැනීමට කටයුතු කරනු ලැබේ.